# 12.

# ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය

### සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන.




කුමාර රත්නායක.

සාලිය යාලේපොල.

# 12. 1

## නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්කම් විමර්ශනය කිරීම.

නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්කම් හඳුනා ගැනීමේ පහසුව සඳහා අවධි 05කට බෙදා දැක්විය හැකි ය.

1. 1948 - 1960 දක්වා අවධිය.
2. 1961 - 1977 දක්වා අවධිය.
3. 1977 - 1994 දක්වා අවධිය.
4. 1994 - 2015 දක්වා අවධිය.
5. 2015න් පසු අවධිය.

### 01. 1948 – 1960 දක්වා අවධිය.

මෙම අවධියේ ප්‍රධාන ලක්ෂණ.

1. යටත් විජිත යුගයේ පැවති ලක්ෂණ සුළු වෙනස්කම් සහිත ව ක්‍රියාත්මක විය.
2. ලෝක බැංකු බලපෑම් ප්‍රථම වතාවට ආර්ථිකය මත පතිත වීම.
3. ආර්ථික සංවර්ධනයේ උපාය මාර්ගයක් ලෙස කෘෂිකර්මයට හා කර්මාන්තවලට ප්‍රමුඛ තැනක් ලබා දීම.
4. යැපුම් කෘෂිකර්මය හා ගොවි ජනපද ව්‍යාපාරයේ ප්‍රගතියක් ඇති වීම.
5. ගෙවුම් ශේෂ අර්බුදය ආරම්භ වීම.
6. ආර්ථික ක්‍රම සම්පාදනය හා සැලසුම් සම්පාදනය ආරම්භ වීම.
7. අර්ධ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
8. පුළුල් සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
9. ජනසතු ව්‍යාපාරය ආරම්භ වීම.

### 02. 1961 – 1977 දක්වා අවධිය.

මෙම අවධියේ ප්‍රධාන ලක්ෂණ.

1. අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.
2. විනිමය පාලනය, ද්විත්ව විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
3. ආනයන පාලනය.
4. විදේශ විනිමය අර්බුද ඇති වීම.
5. අපනයන විවිධාංගිකරණය.
6. රාජ්‍ය අංශයේ මහා පරිමාණ කර්මාන්ත ආරම්භ වීම.
7. දේපොළ හා වත්කම් ප්‍රතිව්‍යාප්තිකරණය.
8. විනිමය අනුපාත ප්‍රතිසංස්කරණය.

### මෙම අවධි දෙක තුළ ක්‍රියාත්මක වූයේ ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තියකි.

- ❖ ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තියක් යනු විදේශ රටවලින් ආනයනය කරන භාණ්ඩ සීමා කර දේශීය ව එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමට පසුබිම සකස් කිරීම ය.
- ❖ පළමු ව සුඛෝපභොගී භාණ්ඩ හා අත්‍යවශ්‍යය නො වන භාණ්ඩ ආනයනය සීමා කළ අතර එම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම ආරම්භ කළේ ය.
- ❖ දෙවනුව අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සීමා කළ අතර ඒවා දේශීය නිෂ්පාදනයට හා අභ්‍යන්තර හුවමාරුව සීමා කිරීම මඟින් වෙළෙඳ පොල අතරමැදියන් ලබන වාසිය සීමා කළේ ය.
  ( හාල්, මිරිස්, ලූණු ප්‍රවාහනය සීමා කිරීම මෙහි දී සිදුවිය.)
- ❖ ආනයන ආදේශන කෘෂි නිෂ්පාදනයන් ලෙස සහල්, ලූණු, මිරිස්, කවුපි, මුං ඇට, කුරක්කන් ආදී නිෂ්පාදන දිරිගැන්වීය.
- ❖ ආනයන ආදේශන කර්මාන්ත ලෙස සබන්, සුවඳ විලවුන්, රෙදි පිළි, ඇඟළුම්, බෙහෙත් ආදී පාරිභෝගික භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය දිරිගැන්වීය.
- ❖ මෙකල පැවති විදේශ විනිමය අර්බුදය හා ගෙවුම් ශේෂ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා මෙම ආනයන පාලනය හා විදේශ විනිමය වෙළෙඳ පොළ සීමා කිරීම් සිදු කරන ලදී.

## 03. 1978 - 1994 දක්වා අවධිය.

1. අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
2. ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇති කිරීම.
3. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය ඉවත් කර පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
4. පාලන ප්‍රතිපත්ති ඉවත් කර ඉල්ලුම් හා සැපයුම් බලවේග ඔස්සේ ක්‍රියාත්මක වන මිල ක්‍රමයකට ඉඩ සැලසීම.
5. ශුභසාධන ප්‍රතිපත්ති සීමා කිරීම.
6. ආර්ථික විවෘත කිරීම.
7. ආයෝජන ප්‍රවර්ධන කාලප පිහිටුවීම.
8. පෞද්ගලීකරණය, ප්‍රතිව්‍යුහගතකරණය වැනි සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
9. දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

## 04 . 1994 - 2015 දක්වා අවධිය.

1. දේශීය ආර්ථික ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක කිරීම.
2. විදේශ ආයෝජන සීමා කිරීම.
3. උතුරු නැගෙනහිර යුද්ධය අවසන් කිරීමට විශාල වියදමක් දැරීමට සිදුවීම.
4. විදේශ ණය ගැනීම් කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු වීම.
5. දේශීය කර්මාන්ත හා ඉදිකිරීම් කෙරෙහි පුළුල් රාජ්‍ය අනුග්‍රහය දැක්වීම.

## මෙම අවධි දෙක තුළ ක්‍රියාත්මක වූයේ අපනයනාභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියකි.

- ❖ අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියක් යනු, අපනයන ආදේශන ලෙස දේශීය වෙළෙඳ පොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට විදේශ වෙළෙඳ පොළ ඉලක්ක කර ගෙන තරගකාරී ව භාණ්ඩ නිෂ්පාදනය කරන කාර්මීකරණ ප්‍රතිපත්තියකි.
- ❖ මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම ආරම්භ වූයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් 1977න් පසු කාල පරිච්ඡේදය තුළ ය.
- ❖ අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියක ප්‍රධානතම ඉලක්කය වන්නේ ආනයන සීමා කිරීම නො ව අපනයන තරගකාරීත්වය හා අපනයන විවිධාංගීකරණය මඟින් ලෝක වෙළෙඳ පොළ තුළ සිට කොටස පුළුල් කර ගැනීම ය.

  1977න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ සෙසු ඉලක්ක වූයේ,

  1. ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය.
  2. විදේශ විනිමය ගැටලු නිරාකරණය.
  3. ආර්ථික වර්ධන උපාය මාර්ග ලෙස අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය.
  4. අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම.
  5. සේවා නියුක්ති අවස්ථා පුළුල් කිරීම සඳහා අපනයන වෙත යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය.
  6. විදේශ විනිමය වෙළෙඳ පොළ ප්‍රසාරණය කරනු පිණිස අපනයන ප්‍රසාරණය.

### අපනයනාභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියක විශේෂ ලක්ෂණ.

1. මෙය විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ අනුබලයක් ලෙස ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්තියකි.
2. නිදහස් වෙළෙඳාමට ඉඩ ලැබෙන පරිදි ආනයන හා අපනයන සීමා ඉවත් කිරීම.
3. විදේශ විනිමය සීමා ඉවත් කිරීම.
4. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් අනුගමනය කිරීම.
5. නිල විනිමය ක්‍රමය හා වි. වි. හි. ස. විනිමය අනුපාතය අහෝසි කොට ඉල්ලුම හා සැපයුම් මත තීරණය වන නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් ඇති කිරීම.
6. විදේශ විනිමය රට තුළට ගලා එන පරිදි පැවති විනිමය අනුපාතය 100% කින් අවප්‍රමාණය කිරීම.
7. විදේශ විනිමය වෙළෙඳ පොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම, විදේශ බැංකු හා මූල්‍ය ආයතනවලට රට තුළට පැමිණීමට ඉඩ හසර ලබා දීම.
8. ආනයන තීරු බදු ඉවත් කිරීම හා ලිහිල් කිරීම.
9. අපනයන සඳහා පැවති රාජ්‍ය ඒකාධිකාරය අහෝසි කර තරගකාරීත්ව අපනයනයට අවස්ථාව සලසා දීම.

## 05. 2015න් පසු අවධිය.

- නව ආණ්ඩුවක් බලයට පත්වීම.
- 2025 ආර්ථික දැක්ම වැඩසටහන අනුව 2025 වර්ෂය වන විට ලංකාව පොහොසත් රටක් බවට පත්කිරීම
- 2017 - 2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන අනුව රජයේ ඉලක්කය වන්නේ,
    1. ඵලදායිතාව හා තරගකාරීත්වය දියුණු කිරීම මගින් අපනයනවල ආදායම අඩුවීම වැළැක්වීම.
    2. ආයෝජන හිතකාමී ප්‍රතිපත්ති තුළින් විදේශ ආයෝජන ගලා ඒම ප්‍රවර්ධනය කිරීම.
    3. රාජ්‍ය ආදායම ඉහළ නැංවීම, රාජ්‍ය වියදම් ඉහළ නැංවීම හා රාජ්‍ය වියදම් සංකෝචනයට අවශ්‍යය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
    4. වාර්ෂික රාජ්‍ය ණය සේවා බර අඩු කර ගැනීම සඳහා රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම.
    5. මානව සම්පත්වල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා රාජ්‍ය වියදම් වැඩි කිරීම.
    6. ආර්ථික හා සාමජ ක්ෂේත්‍රයේ ගුණාත්මක බව තහවුරු කිරීම.
    7. පරිසර සංරක්ෂණය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානයට යොමු කිරීම.

## පසුගිය විභාග ප්‍රශ්න

**(2020 උසස් පෙළ ( නව)**

01. (iv) ''නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන අත්දැකීම් පැහැදිලි ව පෙන්වා දෙනුයේ ආර්ථික ප්‍රතිපත්ති තීරණය කරනු ලැබ ඇත්තේ බොහෝ දුරට කාර්යක්ෂමතාව මත පදනම් ව නො ව දෘෂ්ටිවාදයන් මත පදනම් ව ය.'' නිදසුන් සහිත ව මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. ( ලකුණු 05)

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

- ආර්ථික වෘද්ධිය ජනනය කිරීමට වඩාත් යෝග්‍ය වන්නේ පවත්නා තත්වයට ගැළපෙන ප්‍රායෝගික ආර්ථික ප්‍රතිපත්ති මිස දෘෂ්ටිවාද මත එල්බ ගත් ප්‍රතිපත්ති නො වේ. නැගෙනහිර ආසියාතික රටවල ශීඝ්‍ර ආර්ථික වර්ධනය පිටුපස දැකිය හැකි සත්‍යය වනුයේ ප්‍රතිපත්තිවල ප්‍රායෝගික ස්වභාවය යි. ශීඝ්‍ර ආර්ථික වර්ධනය සඳහා විවෘත ආර්ථික ප්‍රතිපත්ති වඩාත් සුදුසු වෙතැ'යි හඳුනාගෙන විදේශීය ආයෝජකයින්ට ඔවුහු ඇරයුම් කළහ. ඒ අනුව අපනයනාභිමුඛ ආර්ථික වෘද්ධි උපාය මාර්ග සැකසුණි.
- දෘෂ්ටිවාද මත එල්බ ගෙන සිටීමත්, ප්‍රායෝගික ප්‍රතිපත්ති ගැනීමට අසමත්වීමත් නිසා කාර්යක්ෂම ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකාව අසමත් වීම. අනික් අතට බලන විට අතීතයේ අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කළ බොහෝ සමාජවාදී රටවල් වර්තමානයේ නිදහස් ආර්ථික හා වෙළෙඳ ප්‍රතිපත්ති කරා යොමු ව සිටින බව ද සැලකිය යුතු ය. (ලකුණු 02)
- ශ්‍රී ලංකාව කාර්යක්ෂමතාව පදනම් කරගත් ප්‍රතිපත්ති වෙනුවට දෘෂ්ටිවාද පදනම් කර ගත් ප්‍රතිපත්ති යොදා ගත් බවට නිදහසින් පසු කාලය තුළ අත්දැකීම් මැනවින් පෙන්වා දෙයි. ඉතා හොඳ උදාහරණයක් වන්නේ ව්‍යාපාරික වතු ජනසතු කිරීමයි. එහෙත් විශාල ලාභ උපයමින් භාණ්ඩාගාරයට බදු ආදායම් ලබාදුන් එම ව්‍යාපාර රාජ්‍ය හිමිකාරීත්වයට පත්වීමෙන් පසු විශාල අලාභ ලබන ඒකක බවට පත්විය. ඒවා නඩත්තු කිරීමට දිගින් දිගට ම රාජ්‍ය භාණ්ඩාගාරයේ අරමුදල් සැපයීමට ද සිදුවිය.
- එසේ ම රාජ්‍ය ව්‍යවසායන් 300කට අධික ප්‍රමාණයක් අලාභ ලබමින් කටයුතු කරන බව වාර්තා වේ. දෘෂ්ටිවාද මත එල්බ ගැනීම නිසා ඒවා කාර්යක්ෂම ව්‍යාපාර බවට ප්‍රතිසංවිධානය කර ගැනීමට හෝ පෞද්ගලීකරණය කර ගැනීමට හෝ පසුබට වී ඇත. එහි ප්‍රතිඵල වශයෙන් වාර්ෂික ව භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයමින් පාඩු ලබන ව්‍යාපාර එලෙස ම පවත්වා ගැනීමට සිදුව ඇත.
- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීමට රජය මැළිවීමට විවිධ හේතු බලපායි. ජනප්‍රිය මතවාදයක් වී ඇත්තේ රජයේ දේපොළ විකිණීම අපරාධයක් බව ය. මහජනතාව වෙත ලබා දී ඇති අදහස වන්නේ පෞද්ගලීකරණය යනු රජයේ වත්කම් විකුණා දැමීමක් බවයි.

- ❖ මීට ඉහත කාලයක් රාජ්‍ය ව්‍යවසායන් රැසක් පෞද්ගලීකරණය කරන ලදී. ඒ අතර දුරකථන සේවය. ගුවන් සේවය, ගෑස් සමාගම් විය. දුරකථන සේවය පෞද්ගලීකරණ කිරීමෙන් පසු ඉතා විශිෂ්ට සේවා සපයන්නෙක් බවට පත්ව ඇත. ගුවන් සේවයේ කළමනාකරණ ක්‍රියාවලිය පෞද්ගලීකරණයට ලක් කිරීමෙන් විශාල ලාභයක් රජය උපයා ගත්තේ ය. පසුව රජය නැවතත් එය රජයට පවරා ගත් පසු විශාල අලාභ ලබන්නට පටන් ගත්තේ ය.
- ❖ රාජ්‍ය ව්‍යවසායයන්ගේ පැවැත්ම දේශපාලකයන්ට ඉතා වාසිදායක ය. ඒවා දූෂිත ගනුදෙනුවලට හා හිතවතුන්ට රැකියා සැපයීමට ප්‍රබල දායකත්වයක් ලබා දෙයි.
- ❖ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ප්‍රතිපත්තියට ද මේ ආකාරයට ම දෘෂ්ටිවාද පදනම් කරගත් එකක් මිස ප්‍රායෝගික තත්ත්වයන් හඳුනාගෙන සකසා ගත් එකක් නො වේ. 1977 දී නිර්බාධ වෙළෙඳ ප්‍රතිපත්තියට ශ්‍රී ලංකාව අවතීර්ණ වූ නමුත් කල්යාමේ දී එහි නිර්බාධවාදය සිඳී ගොස් ඇත. නිර්බාධ වෙළෙඳාම හඳුන්වාදීමේ දී ශ්‍රී ලංකාව 1977 දී දකුණු ආසියාවේ පුරෝගාමී රටක් බවට පත්වුව ද වර්තමානය වන විට ශ්‍රී ලංකාව දැඩි ආරක්ෂණවාදයට යොමු වූ රටක් බවට පත් ව ඇත. ආනයන මත බදු පැනවීමත් බදු මත තවත් බදු පැනවීමත් නිසා මේ තත්ත්වය පැන නැඟී ඇත. ආනයනික යෙදවුම් මත දැඩි බදු පැනවීම මඟින් නිෂ්පාදන කර්මාන් ක්ෂේත්‍රයේ අපනයන ප්‍රවර්ධනය දුෂ්කර ක්‍රියාවක් වනු ඇත.

( එක් උදාහරණයකට ලකුණු 01 බැගින් උදාහරණ තුනකට ලකුණු 03)

**(2019 උසස් පෙළ ( පැරණි)**

02. (i) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති දේශපාලන රෙජිමයන්ගේ වෙනස් වීම සමඟ ම වෙනස් වී ඇති ආකාරය සැකවෙන් විස්තර කරන්න. ( ලකුණු 05)

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

නිදහසින් පසු ගත වූ දශක හතක කාලය තුළ ශ්‍රී ලංකාව විවිධ සංවර්ධන ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාවට නංවා ඇත. ඒවා දේශපාලන රෙජිමයන්ගේ වෙනස්වීමත් සමඟ ම වෙනස් වී ඇත. පහතින් කෙටියෙන් දක්වා ඇත්තේ දේශපාලන රෙජිමයන්ගේ වෙනස් වීම මත සංවර්ධන ප්‍රතිපත්ති වෙනස් වූ අයුරු දැක්වෙන අවධි කිහිපයකි.

- ❖ **<u>1948 - 1954 විවෘත ආර්ථික ප්‍රතිපත්ති සමඟ ජනප්‍රියවාදී ආර්ථික ප්‍රතිපත්ති.</u>**

  එක්සත් ජාතික පක්ෂය සමස්ත රට ම ආවරණය වන පරිදි ජනප්‍රිය සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම. ආහාර සහනාධාර වැඩසටහන, රජයේ කාර්යභාරය පටු රාජ්‍ය නිර්බාධවාදය සහ යටත් විජිත රාජ්‍යය වෙතින් ව්‍යුත්පන්න වී තිබූ රාජ්‍ය මැදිහත්වීම් යන දෙකෙහි සම්මිශ්‍රණයකින් සිදුවීම.
- ❖ **<u>1956 - 1965 ආර්ථික පාලනයන් සමඟ ජනප්‍රියවාදී ආර්ථික ප්‍රතිපත්ති.</u>**

  1956 දී දේශපාලන රෙජිමය වෙනස් වූ අතර මහජන එක්සත් පෙරමුණ නමින් සභාග රජයක් පිහිටු විය. රාජ්‍ය ධනවාදය, රජයේ කාර්යභාරය පුළුල් වීම, මූලෝපායික කර්මාන්ත රජයේ ඒකාධිකාරය යටතේ පවත්වා ගෙන යාම, මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත සඳහා රාජ්‍ය ආරක්ෂණය ලබා දීම, දේශීය කාර්මීකරණය සඳහා ආනයන ප්‍රතිපත්ති සහ 1959 - 1968 සඳහා දස අවුරුදු සැලැස්මක් හඳුන්වා දීම.
- ❖ **<u>1965 - 1970 සීමිත ප්‍රමාණයක නිර්බාධ ආර්ථික ප්‍රතිපත්ති.</u>**

  දේශපාලන රෙජිමය වෙනස් වූ අතර එක්සත් ජාතික පක්ෂයේ මූලිකත්වයෙන් සභාග රාජයක් පිහිටු විය. නිෂ්පාදනය හා බෙදාහැරීම සඳහා මෙම රෙජිමය විසින් වෙළෙඳ පොළ යාන්ත්‍රණය යොදා ගැනීම, රාජ්‍ය ව්‍යවසායන් හඳුන්වා දීම සිදු නො කිරීම, රජයේ වියදම් යටිතල පහසුකම් සංවර්ධනයට කේන්ද්‍රගත කිරීම. සාම්ප්‍රදායික නො වන අපනයන ප්‍රවර්ධනය, ආනායන පාලන ලිහිල් කිරීම, සහ 1966 - 1970 කෘෂිකාර්මික සංවර්ධන යෝජනා වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

- **<u>1970 - 1977 දේශීය ආර්ථිකය ඉලක්ක කරගත් ආනයන ආදේශන කාර්මීකරණය.</u>**

  දේශපාලන රෙජිමය වෙනස් වූ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ තරගත් රජයක් බිහි විය. ප්‍රතිසංස්කරණ හරහා ශ්‍රී ලංකාව සමාජවාදී රජයකට ගෙනයාමට උත්සාහ කළේ ය. අභ්‍යන්තරාභිමුඛ ආනයන ආදේශන ප්‍රතිපත්ති හඳුන්වා දීම.

- **<u>1977 - 2005 ආර්ථික නිර්බාධකරණය.</u>**

  1977 දී එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි අතර දේශපාලන රෙජිමය වෙනස් වීම මත නැවතත් සංවර්ධන ප්‍රතිපත්ති වෙනස් විය. නැවතත් පෞද්ගලික අංශයේ වර්ධනයට සහ ආර්ථික නිදහස්කරණය දෙසට සංවර්ධන ප්‍රතිපත්ති යොමු විය.

  බාහිරාභිමුඛ කාර්මීකරණය සහ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම.

  එක්සත් ජනතා නිදහස් සංධානය 1995 - 2002 කාලය තුළ පාලනය කළ අතර ආර්ථික ප්‍රතිපත්තියේ කැපී පෙනෙන වෙනසක් සිදු නොවුණි. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය පිළිගත් අතර එයට මානුෂීය මුහුණුවරක් දීමට උත්සාහ කළේ ය. 2002 - 2004 නැවතත් එක්සත් ජාතික පක්ෂය විසින් රජයක් පිහිටුවීය.

- **2005 - 2015 ආරක්ෂණවාදය සමඟ ජාතික ප්‍රතිපත්ති සහ පශ්චාත් සිවිල් යුද යටිතල පහසුකම් සංවර්ධනය.**

  ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පෙරටු කරගත් එක්සත් ජනතා නිදහස් සංධානය 2005 දී නැවත බලය ලබා ගැනීමත් සමඟ දේශපාලන රෙජිමය වෙනස් විය. මෙම රජය නව ලිබරල් ආර්ථික ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කළ අතර, ජාතික ආර්ථික ප්‍රතිපත්ති, දේශීය කර්මාන්ත සහ ග්‍රාමීය යටිතල පහසකම් සංවර්ධනයට ප්‍රමුඛත්වයක් දුණි. පෞද්ගලීකරණය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කළ අතර, පශ්චාත් යුද කාල පරිච්ඡේදය තුළ විශාල පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති හඳුන්වා දුණි.

- **<u>2015 සිට දැනුම කේන්ද්‍රීය වෙළෙඳ පොල ආර්ථිකය.</u>**

  2015 දී එක්සත් ජාතික පක්ෂයේ මූලිකත්වය ඇති ව නැවත දේශපාලන රෙජිමය වෙනස් විය. 2025 දැක්ම 2017 - 2020 රජයේ ආයෝජන වැඩසටහන 2018 - 2022 ජාතික අපනයන ප්‍රතිපත්තිය හඳුන්වා දීම.

  තිරසර සංවර්ධන ඉලක්ක සහ යහපාලන මූලධර්ම භාවිතයට ගැනීම. නිදහස් වෙළඳ ගිවිසුම්, ද්වීපාර්ශවීය වෙළෙඳ ගිවිසුම්, පෞද්ගලික - රජයේ හවුල්කාරීත්වයන්, අපනයන මත පදනම් වූ ආර්ථික වර්ධනය, ඵලදායිතාවයේ සහ තාක්ෂණික වර්ධනය, මානව සංවර්ධනය, ආයෝජන දිරිගැන්වීම, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම. දැනුම මත පදනම් වූ සමාජ වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් මත සේවා වියුක්ති ගැටලුවට සහ සංවර්ධනය කරා ප්‍රවේශවීම.

  ( ඕනෑම රෙජීම වෙනසක් සඳහා එක් ලකුණ බැගින් මුළු ලකුණු 05. රෙජීම වෙනස්වීම කෙටියෙන් ලියා තිබීම ප්‍රමාණවත් ය.)

**(2018 උසස් පෙළ )**

03. (iii) 1977 දී ලංකාවට හඳුන්වාදුන් ආර්ථික නිර්බාධිකරණ ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග වයේ කවර දැ ද?

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

- ආනයන මත පනවා තිබූ ප්‍රමාණාත්මක සීමා ඉවත් කොට ආනයන තීරු බදු ක්‍රමයක් හඳුන්වා දීම.
- විනිමය පාලනය ලිහිල් කිරීම හා බහුවිධ විනිමය අනුපාතිකය වෙනුවට ඒකීය විනිමය අනුපාතිකයක් හඳුන්වා දීම.
- දේශීය මුදලේ විදේශීය අගය වෙළෙඳ පොළ බලවේග මත ප්‍රධාන වශයෙන් තීරණය වීමට ඉඩහැරීම. පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වා දීම.
- විදේශ සංචාර, විදේශ අධ්‍යාපනය සහ ආනයන මත පනවා තිබූ සීමාවන් රැසක් ලිහිල් කිරීම.
- මිල පාලනයන් හා නියමයන් සැලකිය යුතු ලෙස ඉවත් කිරීම.
- තිරිඟු පිටි, පොහොර, කිරි ආහාර වර්ග, ඛනිජ තෙල් නිෂ්පාදිත මත ලබා දුන් සහනාධාර අඩු කිරීම.

- ❖ විදේශ ප්‍රාග්ධනය ආකර්ශනය කරනු පිණිස කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි විදේශ ආයෝජනයන් මත පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීම.
- ❖ ආයෝජන මණ්ඩලය, යටතේ විදේශ ආයෝජකයන් සඳහා ඉතා පුළුල් පහසුකම් සමූහයක් ලබා දීම.
- ❖ බැංකු පද්ධතිය තුළට ප්‍රවේශ වීම වළක්වමින් තිබූ සීමා ඉවත් කර දේශීය හා විදේශීය බැංකුකරුවන්ට ක්ෂේත්‍රය විවෘත කිරීම.
- ❖ පොලී අනුපාතිකය මත තිබූ පාලනයන් ඉවත් කිරීම.

( එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම අංග පහකට ලකුණු 05)

**(2012 උසස් පෙළ )**

04. () 1977 - 2004 කාලය තුළ ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති සමග සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධන ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලකෂණ කවරෙ ද? ( ලකුණ 05)

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

- ❖ 1977 - 2004 කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ නිර්බාධකරණ ආර්ථික ප්‍රතිපත්තිය මූලික වශයෙන් පදනම් ව තිබුණේ '' නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති රාමුව '' මත ය. වර්තමාන රජයේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති රාමුව ප්‍රතික්ෂේප කර දේශීය ප්‍රභවය සහ ස්වදේශිකත්වය සහිත මොඩලයක් අනුගමනය කරන බව ප්‍රකාශ කොට තිබේ.
- ❖ 1977 - 2004 ආර්ථික ප්‍රතිපත්තිය අපනයන ඉහළ නැංවීම කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් ලබා දුන් අතර වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය දේශීය කෘෂිකර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යන ක්ෂේත්‍ර කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් ලබා දී ඇත.
- ❖ 1977 - 2004 ආර්ථික ප්‍රතිපත්ති යටතේ ආර්ථිකය පෞද්ගලික ආයෝජනය හා වෙළෙඳ පොළ යාන්ත්‍රණය කෙරෙහි දැඩි රඳා පැවැත්මක් දැක්වූ අතර රජය ආර්ථිකය තුළ හකුලා ගැනීමක් පෙන්නුම් කළේ ය. වර්තමාන ආර්ථික ප්‍රත්පත්ති යටතේ අර්ථිකය තුළ රජයේ ආධිපත්‍යය ඉතා පුළුල් ලෙස ව්‍යාප්ත කර තිබේ.
- ❖ 1977 - 2004 ආර්ථික ප්‍රතිපත්තිය තුළ පෞද්ගලීකරණ්‍ය ප්‍රතිපත්තිමය වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් හිමි කරගෙන සිටි අතර වර්මතාන ආර්ථික ප්‍රතිපත්තිය පෞද්ගලීකරණය ප්‍රතිකෂේප කර ඇත. රාජ්‍ය දේපොළ විකිණීම වෙනුවට බඳු දීම කරනු ලැබේ.
- ❖ 1977 - 2004 කාලයේ දී සමස්ත ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීමේ අරමුණට ප්‍රමුඛතාවක් ලබාදුන් අතර එහි ව්‍යාප්ති ප්‍රතිවිපාක කෙරෙහි වැඩි සැලකිල්ලක් නො දැක්විණි. වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රදේශීය සංවර්ධන විෂමතා ඉවත් කිරීමට යොමුවුණු වෘද්ධි උපාය මාර්ග කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.
- ❖ 1977 - 2004 කාලයේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ රජය සුභසාධන වියදම් දැඩි සීමා කිරීමකට නතු කරනු ලැබුව ද වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය තුළ සුභසාධන වියදම් කප්පාදු කර නොමැත. පොහොර සහනාධාරය වැනි දීමනා නැවත ලබා දීම.
- ❖ 1977 - 2004 ආර්ථික ප්‍රතිපත්තිය බාහිරාභිමුඛ සංවර්ධන උපාය මාර්ග කෙරෙහි දැඩි විශ්වාස තබා තිබූ අතර වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය අනයන ආදේශනය කෙරෙහි විශාල බලාපොරෙත්තුවක් තබා ඇත.

( එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05)

**(2009 උසස් පෙළ )**

05. (ii) ශ්‍රී ලංකාවේ දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුවෙහි සඳහන් අභිලාෂත්මක වෘද්ධි ඉලක්ක අත් කර ගැනීමේ දී ආණ්ඩුව මුහුණ දෙන ප්‍රධාන අභියෝග කවරේ ද? ( ලකුණු 05)

**පිළිතුරට අඩංගු විය යුතු කරුණු.**

මෙම වර්ෂයේ අභිලාෂාත්මක වෘද්ධි ඉලක්කය වනුයේ, ඉදිරි වසර 10 සඳහා 8%ක වාර්ෂික වෘද්ධි අනුපාතිකයක් පවත්වා ගෙන යාම හා ඉන් පසු කාලත තුළ 9 – 10 % වෘද්ධි අනුපාතිකයක් ඉලක්ක කර තිබේ.

❖ ආර්ථික වෘද්ධි ඉලක්ක අත් කර ගැනීමට ප්‍රමාණවත් ආයෝජන මට්ටමක් පවත්වා ගෙන යාමට අවශ්‍යය සම්පත් නො තිබීම.

ඉදිරි වසර 10 සඳහා ආයෝජන මට්ටම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 32% - 38% තරම් ප්‍රමාණයක් විය යුතු යැ'යි අපේක්ෂා කෙරේ. එහෙත් වර්තමාන ජාතික ඉතුරුම් අනුපාතිකය 20% ක් පමණි. මේ සම්පත් පරතරය පියවා ගැනීම මූලික අභියෝගයකි.

❖ ගෝලීය වශයෙන් දැනට පවත්නා අයහපත් ආර්ථික වාතාවරණය තුළ සහනාධායක පදනමකින් විදේශ සම්පත් ගැනීමට ඇති ඉඩකඩ සීමා සහිත වේ.

❖ යුද්ධයෙන් අවතැන් වූ ජනගහනය පුනරුත්තාපනය කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.

❖ උතුරු නැගෙනහිර ප්‍රදේශ සංවර්ධන ක්‍රියාවලි සක්‍රීය කිරීම.

❖ රාජ්‍ය මූල්‍ය ගැටලු ( රාජ්‍ය අයහාරය ප්‍රමාණවත් ව වර්ධනය නො වීම, වර්තන වියදම් පියවා ගැනීමට පවා රාජ්‍ය අයහාරය ප්‍රමාණවත් නො වේ.)

❖ විදේශීය සම්පත් පරතරය පුළුල් වීම.

❖ දේශපාලන අස්ථාවරත්වය.

( එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05)

**(2005 උසස් පෙළ )**

06. (i) නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය පතහ මට්ටමක පැවතීමට බලපාන ලද ප්‍රධාන සාධක කවරේ ද? ( ලකුණු 07)

**පිළිතුරට අඩංගු විය යුතු කරුණු.**

❖ නිශ්චිත ආර්ථික ප්‍රතිපත්තියක් දිගු කාලයක් තිස්සේ අනුගමනය නො කොට එකිනෙකට වෙනස් ආර්ථික ප්‍රතිපත්ති කෙටිකාලීන ව අනුගමනය කිරීම. (ආර්ථික ප්‍රතිපත්තිවල නො ගැළපීම.)

❖ මැතිවරණ චක්‍රය අනුව ආර්ථික ප්‍රිපත්ති දෝලනය වීම.

❖ දිගුකාලීන අවශ්‍යතාව යටපත් ක රමැතිවරණ ජයග්‍රහණ කිරීමට කෙටිකාලීන ව දායක විය හැකි ප්‍රතිපත්ති තෝරා ගැනීම.

❖ බාහිර සාධකවල අයහපත් බලපෑම් හා මිලෙහි දැඩි උච්චාවචන හා ආනයන මිල අඛණ්ඩ ව ඉහළයාම නිසා විදේශ විනිමය අර්බුදයන්ට නිතර නිතර ආර්ථිකය ගොදුරු වීම.

❖ ශ්‍රී ලංකාවට ගලා ආ විදේශ ප්‍රාග්ධනය ද ස්ථාවර උපනතියක් පෙන්නුම් නො කිරීම. (කලින් කලට අඩු වැඩි වීම)

❖ ආර්ථිකයේ විවෘත බව සීමාවීම. (දැඩි පාලනයන්ට නතු වීම.)

❖ යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි සංවර්ධනය නො වීම.

❖ දේශීය ඉතුරුම් පහත් මට්ටමක පැවතීම.

❖ සාර්ව ආර්ථික අස්ථායිතාව ( විශේෂයෙන් රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ අස්ථායිතාව)

❖ ජනවාර්ගික අර්බුදය. ( වාර්ෂික ද. දේ. නි. 23% ප්‍රමාණයක් පහත හෙළීමට බලපායි.)

❖ වෘත්තීය නිපුණතා සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් ආකාරයට අධ්‍යාපන ක්‍රමය වර්ධනය වී නොතිබීම.

❖ අකාර්යක්ෂම රාජ්‍ය සේවය.

( එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතකට ලකුණු 07)

## 12. 2

## ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා.

නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති වූ ව්‍යුහාත්මක වෙනස්කම් දෙකකි.

1. දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහමය වෙනස්කම්.
2. සේවා නියුක්තියේ ව්‍යුහමය වෙනස්කම්.

## 01. දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහමය වෙනස්කම්.

දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහය කාලීන ව පහත පරිදි වෙනස් වී ඇත.

- ❖ කෘෂිකාර්මික නිෂ්පාදනයේ ප්‍රතිශතක වැදගත්කම අඩු වීම.
- ❖ කාර්මික නිෂ්පාදිනයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම.
- ❖ සේවා නිෂ්පාදනයේ ප්‍රතිශතක වැදගත්කම වැඩිවීම.


**කර්මාන්ත මූලාශ්‍ර අනුව දළ දේශිය නිෂ්පාදනය ( පවතනා වෙළෙඳ මිල අනුව)**
**2017 – 2021**

| | ආර්ථික කටයුතු | 2017 | 2018 | 2019 | 2020 | 2021 (ඇ) |
|---|---|---|---|---|---|---|
| 01. | කෘෂිකර්මාන්තය වන වගාව හා ධීවර කර්මාන්තය. | 1 043 994 | 1 146 672 | 1 136 615 | 1 290 885 | 1 514 559 |
| 02. | කර්මාන්ත. | 3 568 560 | 3 752 368 | 4 084 836 | 3 935 697 | 4 680 060 |
| 03. | සේවා | 7 477 148 | 8 191 090 | 8 732 156 | 8 943 498 | 9 668 927 |

**ආර්ථික කටයුතුවල වර්ධනය 2020 - 2021**

| ආර්ථික කටයුතු | වාර්ෂික වර්ධන අනුපාතිකය. | |
|---|---|---|
| | 2020 | 2021 |
| කෘෂිකර්මාන්ත, ධීවර හා වනවගාව. | 2. 2 | 2. 0 |
| කර්මාන්ත. | 6. 9 | 5. 3 |
| සේවා. | 1. 6 | 3. 0 |

**දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය. 2021**





## 02. සේවා නියුක්තියේ ව්‍යුහමය වෙනස් වීම.

- ❖ කෘෂි අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය අඩුවී ඇත.
- ❖ කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.
- ❖ සේවා අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.

# සේවා නියුක්තිය 1977 - 2021

| අංශය | දළ දෙශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක ලෙස. | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1977 | 1993 | 2000 | 2012 | 2014 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| කෘෂිකාර්මික | 26.7 | 21.3 | 19.0 | 11.1 | 10. 1 | 7. 1 | 6.9 | 7. 0 | 7. 0 | 7. 9 | 6. 9 |
| කාර්මික | 22.5 | 22.5 | 25.3 | 30.4 | 32.3 | 26.8 | 26.8 | 26.1 | 26.4 | 25.5 | 25.9 |
| සේවා | 50.1 | 51.3 | 54.7 | 58.6 | 57.6 | 56.5 | 56.8 | 57.6 | 57.4 | 56.7 | 58.3 |

## සේවා නියුක්තිය 2021





දළ දෙශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය තුළ හා සේවා නියුක්තියේ ආංශික සංයුතිය තුළ කෘෂිකාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම අඩු වී කාර්මික හා සේවා අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම වැඩි ඇති බව පෙනේ.

1977න් පසු ශ්‍රී ලංකාව වඩාත් විවෘත ආර්ථික රටාවක් කරා මාරුවීමත් සමග ශ්‍රී ලාංකීය විදේශ සේවා නියුක්ති යසඳහා යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇති බව පෙනී යයි. එහි අතුරු ඵලයක් ලෙස විදේශවලින් ගලා එන ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වී ඇත.


**2020 වර්ෂයට සාපේක්ෂ ව 2021 වර්ෂයේ ශ්‍රම වෙළෙඳ පොළ වෙනස්වීම.**

- ❖ 2020 වසරට සාපේක්ෂ ව 2021 වසරේ දී බොහෝ ශ්‍රම වෙළෙඳ පොළ දර්ශකවල වර්ධනයක් දක්නට ලැබුණ ද තවමත් ශ්‍රම වෙළෙඳ පොළ පූර්ව වසංගත තත්ත්වයට වර්ධණය වී නොමැත.
- ❖ ශ්‍රම බලකාය 2020 වර්ෂයේ මිලියන 8 467ක් වූ අතර 2021 වර්ෂයේ එය මිලියන 8 553ක් දක්වා වර්ධනය විය.
- ❖ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2020 වර්ෂයේ දී 50.6 % වුව ද 2021 වර්ෂයේ දී 49.9 % දක්වා අඩු විය.
- ❖ සේවා නියුක්ති ජනගහනය 2020 වසරේ වාර්තා වූ මිලියන 7 999 සිට 2021 වර්ෂයේ දී 8 114ක් දක්වා ඉහළ ගියේ ය.මෙම සේවා නියුක්තියේ ඉහළ යෑම සඳහා කෘෂිකාර්මික අංශයේ රැකියා අවසථා වැඩිවීම හේතු විය.



## සේවා වියුක්ති අනුපාතිකය. 2014 - 2021




නව රැකියා අවස්ථා උත්පාදනය වීම නිසා සේවා වියුක්ති අනුපාතිකය 2020 වර්ෂයේ වාර්තා වූ 5. 5 සිට 2021 වර්ෂයේ දී 5.1ක් දක්වා පහළ ගියේ ය.

1977න් පසුව ශ්‍රී ලංකාව වාඩත් විවෘත ආර්ථික රටාවක් කරා මාරුවීමත් සමඟ ශ්‍රී ලාංකීය සේවකයන් විදේශ සේවා නියුක්තිය සඳහා යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇත් බව පෙනී යයි. එහි අතුරු ඵලයක් ලෙස විදේශවලින් එන ප්‍රේෂණ වැඩි වී ඇත.

## ආර්ථික වර්ධනය සඳහා අනුගමනය කළ උපාය මාර්ග.

1. විදේශ සේවා නියුක්තිය හා විදේශ ප්‍රේෂණ.
2. යටිතල පහසුකම් සංවර්ධනය.
3. සංචාරක කර්මාන්තය.
4. දැනුම් ආර්ථිකය.
5. ප්‍රාදේශීය සංවර්ධනය.

### 01. විදේශ සේවා නියුක්තිය හා විදේශ ප්‍රේෂණ.

### විදේශ සේවා නියුක්තිය 2019 - 2021

| විදේශ සේවා නියුක්තිය. | 2019 | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු විදේශ රැකියා ප්‍රමාණය | 203 087 | 100 | 53 711 | 100 | 121 795 | 100 |
| මූලයන් අනුව | | | | | | |
| ලියාපදිංචි නියොජිතයන්. | 69 278 | 34.1 | 18 065 | 33.6 | 42 012 | 34.5 |
| වෙනත් | 133 809 | 65.9 | 35 646 | 66.4 | 79 783 | 65.5 |
| ස්ත්‍රී පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 122 257 | 60.2 | 32 500 | 60.5 | 80 670 | 66.2 |
| ස්ත්‍රී | 80 830 | 39.8 | 21 211 | 39.5 | 41 125 | 33.8 |
| ශ්‍රම කාණ්ඩය අනුව. | | | | | | |
| වෘත්තීය | 9 816 | 4.9 | 2 957 | 5.5 | 8 309 | 6.8 |
| මධ්‍යම මට්ටම | 5 725 | 2.8 | 1 496 | 2.8 | 4 216 | 3.1 |
| පුහුණු | 62 711 | 30.9 | 16 664 | 31.0 | 39 971 | 32.8 |
| අර්ධ පුහුණු | 2 950 | 1.5 | 789 | 1.5 | 1 908 | 1.6 |
| නුපුහුණු | 51 188 | 25.2 | 13 987 | 26.0 | 31 497 | 25.9 |
| ගෘහ සේවිකා | 61 489 | 30.3 | 15 322 | 28.5 | 29 399 | 24.1 |

## විදේශ සේවා නියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා.

1. 2021 වර්ෂයේ අග භාගයේ දී සිදු වූ කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම 2020 වර්ෂයේ වාර්තා වූ 53 711 සිට 121 795 දක්වා සියයට 126.8 වර්ධනයක් වාර්තා කළේ ය. ඒ අනුව 2021 වර්ෂයේ අවසාන කාර්තුවේ

61 447ක් ලෙස වාර්තා වූ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව 2016 වසරේ තෙවන කාර්තුවෙන් පසු වාර්තා වූ ඉහළ ම අගය යි. විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්වල මෙම කැපී පෙනෙන ඉහළ යෑමට ශ්‍රමය ලාබ ගන්නා රටවල සංචරණ සීමා ඉවත් කිරීම හා රැකියා අවස්ථා ඉහළ යෑම, රැකියා සඳහා විදෙස් ගතවීමට අපේක්ෂිත පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් සිටීම සහ රැකියා සඳහා විදෙස් ගතවීමට බලාපොරොත්තුවෙන් සිටි පුද්ගලයින් කඩිනමින් එන්නත්කරණය කිරීම හේතු විය.

2. විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන් සංඛ්‍යාව අඛණ්ඩව පහළ යාමට හේතු වූයේ ගෘහ සේවිකා පිටත්ව යෑම් අඩු කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, පිටත්වීමට පෙර සපුරාලිය යුතු පුහුණු අවශ්‍යතා හා මැද පෙරදිග ඝාටවල ආර්ථික පසුබෑසීම හේතුවෙන් ශ්‍රම ඉල්ලුම පහළ යාම හේතු විය.
3. දකුණු කොරියාවේ රැකියා සඳහා පිටත්වීම සැලකිය යුතු වර්ධනයක් මෑත වර්ෂවල දක්නට ලැබිණි. නමුත් ඉන් වැඩි කොටසක් නුහුණු ශ්‍රමිකයන් වේ.
4. 2021 වර්ෂයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්වල වර්ධනය හේතුවෙන් හා 2022 වර්ෂයේ පළමු කාර්තුවේ දක්නට ලැබුණ වර්ධනය හේතුවෙන් 2022 වර්ෂයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කෙරේ.

## විදේශ ප්‍රේෂණ

විදේශ සේවා නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මෙරටට එවන විදෙශ මුදල් හා වෙනත් දෑ විදේශ ප්‍රේෂණ ලෙස හඳුන්වයි. ලංකාවේ මුළු විදේශ ලැබීම් තුළ ඉහළ ම අගයක් හිමි කර ගෙන ඇත්තේ විදේශ ප්‍රේෂණය.

## විදේශ සේවා නියුක්තිය හා විදේශ ප්‍රේෂණ ලැබීම් ආර්ථිකය මත ඇති කරන බලපෑම.

1. සේවා නියුක්ති අනුපාතය ඉහළ යාමට හේතු වීම.
2. පුද්ගලයින්ගේ ආදායම් මට්ටම වැඩි වීම.
3. දරිද්‍රතාව පහළ යාම.
4. කුටුම්භ ඉතුරුම් වැඩිවීම නිසා කුඩා ව්‍යාපාර වර්ධනය.
5. විදේශ ඉපැයීම් වර්ධනය වීම.
6. ගෙවුම් ශේෂ ගැටලුවලට විසඳුම් ලැබීම.
7. විදේශ වත්කම් ශක්තිමත් වීම.
8. මුදලේ විදේශ අගය ශක්තිමත් වීම.
9. දේශීය ශ්‍රම වෙළෙඳ පොළේ පුහුණු ශ්‍රමික හිගයක් ඇති වීම හා වැටුප් මට්ටම් ඉහළ යාම.
10. පුහුණු ශ්‍රමය විදේශ ගත වන විට සම්පත් සම්භාරය සංකෝචනය වීම.
11. ගෘහ සේවා සඳහා කාන්තාවන් සංක්‍රමණය වීම සමාජ ගැටලුවලට හා දරුවන් හුදෙකලා වීම වැනි අනාරක්ෂිත තත්ත්වයනට ගොදුරු වීම.
12. බුද්ධි ගලනය සිදුවීම.

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2017 - 2021

| ප්‍රභවය | රුපියල් මිලියන. | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| මැද පෙරදිග | 565 642 | 582 719 | 618 394 | 680 892 | 560 989 |
| වෙනත් | 526 330 | 555 407 | 582 372 | 626 115 | 526 199 |
| මැද පෙරදිග ප්‍රේෂණ මුළු ප්‍රේෂණවල ප්‍රතිශතයක් ලෙස | 51.8 % | 51.2 % | 51.5 % | 51.7 % | 51.6 % |

1. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල වැඩි ප්‍රතිශතයක් මැද පෙරදිග ලාංකික ශ්‍රමිකයන්ගෙන් ලැබේ. එම ප්‍රමාණය සමස්ත ප්‍රේෂණයන්ගේ ප්‍රමාණයෙන් 50% කට අධික ය.

2. මෑත වර්ෂවල විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ද 2021 වර්ෂයේ දී එහි පහළ යාමක් වාර්තා කර ඇත. මෙම පහළ යාම නිසා ජංගම ගිණුමේ හිගය 2020 වර්ෂයේ ඇමෙරිකන් ඩොලර් මිලියන 1.2ක් වූ අතර 2021 වර්ෂයේ දී එය ඇමෙරිකන් ඩොලර් මිලියන 3.3ක් දක්වා වර්ධනය විය.

3. 2021 වර්ෂයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අඩුවීමට බලපෑ හේතුවක් ලෙස එකවට පැවති නිල විනිමය අනුපාතිකයට සාපේක්ෂ ව අවිධිමත් වෙළෙඳ පොළෙහි විනිමය අනුපාතිකයෙහි කැපී පෙනෙන වෙනසක් පැවතීම හේතුවෙන් විධිමත් මාර්ග හරහා ලැබෙන විදේශ ප්‍රේෂණ අඩු විම දැක්විය හැකිය.

යම් රටක් තුළ මෙන් ම රටින් පිටත දේශ සීමා අතර සිදු කෙරෙන ගනුදෙනුවල දී එම ගනුදෙනුවලට අදාළ ව මුදල් කාර්යක්ෂම ව සහ ආරක්ෂාකාරී ව සංචලනය කළ හැකි ක්‍රමවේදයක් පැවතීම රටක මූල්‍ය පද්ධතියක දැකිය හැකි ලක්ෂණයකි. විශේෂයෙන් ම විදේශ විනිමය යොදා ගනිමින් දේශ සීමා අතර සිදුවන මුදල් මාරුකිරීම්වල දී මෙම කරුණ වඩා වැදගත් වේ. සාමාන්‍යයෙන් රටක මෙලෙස දේශ සීමා අතර සිදුවන මුදල් ගනුදෙනුවලින් බහුතරයක් විධිමත් මුදල් හුවමාරු ක්‍රම හරහා සිදුවේ.

ඒ කෙසේ වුවත් ඕනෑම රටක විශේෂයෙන් ම දේශසීමා අතර සිදුවන මුදල් ගනුදෙනුවල දී විවිධාකාරයේ අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිත කරනු ලබයි. යම් රටක පුරවැසියන් ගනුදෙනු සඳහා විධිමත් මුදල් හුවමාරු ක්‍රම යොදා ගන්නාව ද අවිධමත් මුදල් හුවමාරු ක්‍රම යොදා ගන්නවා ද යන්න එම රටේ ආර්ථිකයේ හා මූල්‍ය වෙළෙඳ පොළේ පවත්නා විවිධ ලක්ෂණ හා එවැනි ගනුදෙනුවල පවත්නා නීත්‍යානුකූල බව මත රඳා පවතී. බලපත්‍රලාභී සහ නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් ජනතාවට සපයනු ලබන මුදල් හුවමාරු කිරීමේ සේවාවන් විධිමත් මුදල් හුවමාරු සේවාවන් ලෙස සැලකේ. එලෙස මුදල් හුවමාරු කිරීමේ සේවාවන් සැලසීම සඳහා නියාමනයට ලක් නො කරන,

- හවාලා, හුන්ඩි හෝ උන්ඩියල් ( දකුණු ආසියාව)
- ෆෙයි කියන් හෝ චිට් ( අග්නිදිග ආසියාව)
- බ්ලැක් මාර්කට් පොසෝ (යුරෝපය)

අවිධිමත් විදේශ මුදල් හුවමාරු ක්‍රම සඳහා නිදසුන් කිහිපයකි.

කෙසේ වෙතත් වර්තමානයේ ජර්මනිය එක්සත් රාජධානිය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ඇතැම් රටවල් එකී රටවල ක්‍රියාත්මක වන මුදල් විශුද්ධිකරණයට එරෙහි තීනිමය අවශ්‍යතා මත පදනම් ව එම රටවල් අවිධිමත් මුදල් හුවමාරු සේවා සපයන්නන් සඳහා ද ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ලබාදීම වැනි නියාමන ප්‍රවේශයන් අනුගමනය කරයි.

විධිමත් බැංකු ක්‍රමයක් භාවිත නොවූ අතීතයේ සිට ම මුදල් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට භෞතික සංචලනයකින් තොර ව මුදල්වල වටිනාකම පමණක් හුවමාරු කර යැවීම සඳහා හවාලා ක්‍රමය අඛණ්ඩ ව භාවිත කර ඇත. නමුත් බැංකු ගනුදෙනු පහසුවෙන් සිදු කළ හැකි නූතනයේ ද විවිධ පුද්ගලයින්, කණ්ඩායම් මෙන් ම ආයතන විසින් නීත්‍යානුකූල නො වන අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතයට ගනී. විශේෂයෙන් එවැනි සේවාවන් මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඇතුළු සාපරාධී ක්‍රියා සඳහා දැඩි ලෙස යොදා ගනී. මෙම ක්‍රමවල දක්නට ඇති ඇතැම් වාසිදායක තත්ත්වයන් එනම්,

- අඩු ගනුදෙනු පිරිවැය.
- පහසු ප්‍රවේශය.
- අවම ලේඛන කටයුතු.
- ඉක්මනින් මුදල් මාරු කිරීමේ හැකියාව.

යනාදිය මෙම මාධ්‍ය සමාජයේ ප්‍රචලිත වීමට හේතු වී ඇත. නමුත් මෙම මාධ්‍ය භාවිතය වඩා අවදානම් සහගත ය. විශේෂයෙන්,

- මුදල් විශුද්ධිකරණයේ නියැලෙන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් විසින් අනිසි භාවිතයට ඉඩ කඩ ඇත.
- ආර්ථිකයක විධිමත් අංශයේ සිට අවිධිමත් අංශය වෙත ආර්ථික සම්පත් ගලා ඒම.
- රටක මූල්‍ය පද්ධතියේ සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑම.

**අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම රටක මූල්‍ය වෙළෙඳ පොළට හා ආර්ථිකයට කරන බලපෑම.**

- බදු ආදායම් අඩුවීම.

මේ නිසා බදු පැහැර හැරීමේ මාර්ගවලට ඉඩ සැලසේ. මේ නිසා රජයට සෘජු බදු ආදායම් මෙන් ම වක්‍ර බදු ආදායම් ද අහිමි වේ. මෙම ගනුදෙනු තොරතුරු දේශීය ආදායම් ගනුදෙනුවලට හසු නොවීමත්, ලේඛන ගත නොවීමත් නිසා අදාළ බදු ආදායම් නො ලැබී යයි. බදු ආදායම් අහිමි වී යාම නිසා රාජ්‍ය ආදායම කෙරෙහි සෘණාත්මක බලපෑමක් සිදුවේ.

- ගෙවුම් ශේෂ හා විදේශ සංචිත කෙරෙහි බලපෑමක් ඇති වීම.
  ශ්‍රී ලංකාව වැනි නැගී එන ආර්ථිකයක් ඇති රටක වැදගත් අංගයක් ලෙස විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ දැක්විය හැකිය. ශ්‍රමිකයන් අවිධිමත් ක්‍රම හරහා සිය ඉපැයීම් ප්‍රේෂණය කරන විට ගෙවුම් තුලන ගණනය කිරීම්වල දී එම ඉපැයීම් සැලකිල්ලට නො ගනී. ඒ නිසා යම් රටක විදේශ අංශයේ සැබෑ තත්වය ගෙවුම් තුලනයෙන් නිරූපණය නො වේ. තව ද විදේශ සංචිත ගොඩනැගෙනුයේ විධිමත් මාර්ග හරහා එවනු ලබන ප්‍රේෂණ මාර්ගයෙන් වන නිසා රටක විදේශ සංචිත ඉහළ නැංවීම සඳහා මෙවැනි ගනුදෙනු උපකාරී නොවේ. මේ නිසා විදේශ සංචිත පහත යා හැකිය.
- මුදල් සැපයුම කෙරෙහි බලපෑම් ඇති කිරීම.
  භෞතික මුදල් සංචලනයක් සිදු නො වන බැවින් මෙවැනි ගනුදෙනු හේතුවෙන් ආර්ථිකයක පුළුල් මුදල් සැපයුම මත ඇති කරන සෘජු බලපෑම ශුන්‍ය වේ. කෙසේ වෙතත් මුදල් ලැබෙන රටේ පුළුල් මුදල් සැපයුමේ සංයුතිය මෙවැනි ගනුදෙනු නිසා බලපෑමට ලක්විය හැකිය. ඊට හේතුව වන්නේ මෙම ගනුදෙනු භෞතික මුදල් භාවිතය කෙරෙහි නැඹුරු වීම නිසා බැංකු තැම්පතුවල අඩුවීමක් ඇති වන බැවිණි. මෙම මාධ්‍ය විසින් බැංකු ක්ෂේත්‍රය කෙරෙහි ඇති කරන සෘණාත්මක බලපෑම සහ මුදලට ඇති ඉල්ලුමේ අස්ථාවරත්වය ඇති කිරීමට සමත් වන ආකාරයේ මුදල් ආර්ථිකයක් නිර්මාණය වීම හරහා මූල්‍ය අතරමැදිකරණය සීමා විය හැකි අතර මුදල් ප්‍රතිපත්තියේ ආකාර්යක්ෂමතා ඇති කරනු ලබයි.
- මුදල් අතරමැදිකරණය කෙරෙහි ඇති කරන බලපෑම.
  බැංකු පද්ධතියෙන් මුදල් කාන්දුවීම හේතුවෙන් බැංකු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සීමා සහිත විය හැකිය. එසේ ම බැංකු විසින් ඉහළ පොලියක් ප්‍රදානය කිරීම හරහා තැම්පතු ආකර්ෂණය කර ගැනීමට උත්සාහ දරන විට වෙළෙඳ පොළ පොලී අනුපාත ඉහළ  යයි. විකල්ප හා අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම හේතුවෙන් මූල්‍ය අතරමැදිකරණයේ සුවිශේෂ කාර්යයන් තර්ජනයට ලක්විය හැකිය. එමෙන් ම බැංකුවලට හිමි ඔවුන්ගේ වෙළෙඳ පොළ කොටස අහිමි වී යාමට ද පුළුවන.
- ජාතික ආරක්ෂාවට ඇති කරන බලපෑම.
  ලෝකයේ සිදුව ඇති මහා පරිමාණ ත්‍රස්තවාදී ප්‍රහාර රැසක් ම අර්ධ වශයෙන් මූල්‍යනය වී ඇත්තේ මෙවැනි අවිධිමත් මූල්‍ය අතරමැදිකරණ හරහා ය. මෙම ක්‍රම බොහෝ දුරට නීති විරෝධී කටයුතු සඳහා ඇති වෙළෙඳපොළවල ගනුදෙනු සිදුවන ක්‍රමයක් ලෙස හඳුනා ගෙන ඇත. ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ යම් යම් මූලාශ්‍රයන් සඳහා අවිධමත් මාධ්‍යයන් යොදා ගන්නා බැවින් එය ත්‍රස්තවාදී මූල්‍යනයට එරෙහි සටනේ ඵලදායිතාවයට ද තර්ජනයක් වේ.

**අවිධිමත් මුදල් හුවමාරු ක්‍රමවලට එරෙහි ව ලංකාව මෑතකාලීන ව ගෙන ඇති ක්‍රියා මාර්ග.**

- හවාලා වැනි අවිධමත් මුදල් හුවමාරු ක්‍රම පිළිබඳ ව ජනතාව දැනුම්වත් කිරීම.
- නීතිවිරෝධී කටයුතුවලට සම්බන්ධ යැ'යි සැකසහිත අරමුදල් මෙම ගිණුම් හරහා ගනුදෙනු වීද යන වග විමර්ශනය මඟින් තහවුරු වන තුරු එවැනි ගනුදෙනුවල යෙදුණු ගිණුම්වල මුදල් ගනුදෙනු සඳහා යොදා ගැනීමේ අවස්ථාව අත්හිටුවීම.
- බැංකු හා අනෙකුත් විධිමත් මූල්‍ය ආයතන හරහා විදේශ ශ්‍රමිකයන්ගේ ඉපැයීම් ප්‍රේෂණය කිරීමට දිරිගැන්වීම.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා පහසුකම් සැපයීමට මහ බැංකුව විසින් '' විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව'' නමින් නව දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම.
- බොහෝ බලපත්‍ර ලාභී වාණිජ බැංකුවල සහභාගීත්වයෙන් '' ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම විසින් පහසුවෙන් ප්‍රේෂණ මාරු කිරීම සඳහා '' ලංකා රෙමිට් '' නමින් ජංගම යෙදවුමක් දියත් කිරීම.

- රුපියල්වලට පරිවර්තනය කළ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ සඳහා නිල විනිමය අනුපාතිකයට වඩා වැඩි තාවකාලික මූල්‍ය දිරිගැන්වීමක් ලබා දීම. ( ඇමරිකන් ඩොලරයට රුපියල් 10ක)
- සංක්‍රමණික සේවකයන්ගේ පවුල්වල සුභසාධනය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. (යෝජිත)

## <u>පසුගිය විභාග ප්‍රශ්න</u>

***( 2021 / 2022 A / L)***

01\. (i) ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුමක් (***Currency swap agreement***) යනු කවරක් ද? ශ්‍රී ලංකාව ඇසුරින් නිදසුනක් දක්වන්න. ( ලකුණු 04)

(iii) ශ්‍රී ලංකා ආර්ථිකය වර්තමානයේ මුහුණ පා සිටින විදේශ විනිමය අර්බුදය විසඳා ගැනීම සඳහා ඔබට යෝජනා කළ හැකි ප්‍රතිපත්ති නිර්දේශ කවරේ ද? ( ලකුණු 04)

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

(i) ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුමක් යනු පාර්ශව දෙකක් විසින් එක හා සමාන වටිනාකමකින් යුත් ව්‍යවහාර මුදල් දෙවර්ගයක් කිසියම් නිශ්චිත කාලයකට එකිනෙකා අතර හුවමාරු කර ගැනීම සඳහා ඇති කර ගනු ලබන ගිවිසුමකි. හුවමාරු කර ගත් මුදල් ප්‍රමාණය වෙනුවෙන් පොලි අනුපාතිකයක් ද දෙපාර්ශවය විසින් එකිනෙකාට ගෙවනු ලැබේ. උදාහරණයක් ලෙසඑ ක් පාර්ශවයක් රුපියල් මිලියන 2 000ක් තීවත් පාර්ශවයකට ලබා දී ඒ වෙනුවට ඇමරිකානු ඩොලර් මිලියන 10ක් අනෙක් පාර්ශවයෙන් ලබා ගත්තා යැ'යි සිතමු. මෙම ගනුදෙනුවට අනුව විනිමය අනුපාතිකය $ = රුපියල් 200ක් වී තිබේ. ගිවිසුම් කාලය අවසානයේ දී නැවතත් එම මුදල් ප්‍රමාණය මුලින් හිමිකර ගෙන තිබූ ආකාරයට එකග වූ විනිමය අනුපාතිකයක් යටතේ දේපාර්ශවය අතර බෙදා ගැනේ.
මේ සඳහා උදාහරණ -

- 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහබැංකුව හා චීන මහජන බැංකුව අතර යුවාන් මිලියන 10ක් (ඇමෙරිකානු ඩොලර් බිලියන 1. 5) වසර තුනක් කාලයක් සඳහා හුවමාරු විය.
- 2021 දී ශ්‍රී ලංකා මහබැංකුව බංග්ලාදේශ මහ බැංකුව සමඟ ඇමරිකානු ඩොලර් මිලියන 200ක් හුවමාරු කර ගැනීම.
- 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ඉන්දියානු සංචිත බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් හුවමාරු කර ගැනීමේ ගිවිසුම.

(iii) **<u>කෙටිකාලීන ක්‍රියාමාර්ග.</u>**

- අත්‍යාවශ්‍යය නො වන භාණ්ඩ ආනයනය සීමා කිරීම.
- පවත්නා විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම.
- ව්‍යාපාර මුදල් හුවමාරු ගිවිසුම් ඇති කර ගැනීම.
- විනිමය අනුපාතිකය වෙළෙඳ පොළ බලවේග යටතේ තීරණය වීමට ඉඩ හැරීම.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම.

**<u>දිගුකාලීන ක්‍රියාමාර්ග.</u>**

- අපනයන අංශය පුනර්ජීවනය කිරීම.
- සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම.
- රාජ්‍ය මූල්‍ය ස්ථායිතාව සඳහා අවශ්‍යය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.
- ගෝලීය නිෂ්පාදන ජාලවලට ප්‍රවේශය ලබා ගැනීම.
- රටට හිතකර නිදහස් වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම.
- ඍජු විදේශ ආයෝජන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයට ආයෝජනය කිරීම.
- කාර්යක්ෂම ආනයන ආදේශන වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- විදේශ ගත ශ්‍රමිකයන්ට වඩාත් ආකර්ෂණීය පහසුකම් ලබා දීම.

***( 2020  A / L ( NEW))***

02. (ii) ශ්‍රී ලංකාව මත කොවිඩ් - 19 වසංගතය සිදු කර ඇති ආර්ථික බලපෑම සැකෙවින් විස්තර කරන්න.

( ලකුණු 05)

<u>**පිළිතුරට අඩංගු විය යුතු කරුණු.**</u>

- රාජ්‍ය මූල්‍ය පීඩනයන්ට හා පහළ වෘද්ධි අනුපාතිකයකට මුහුණ දෙමින් දැනටමත් අභියෝගාත්මක සාර්ව ආර්ථික වාතාවරණයක පසුවන ශ්‍රී ලංකාව ආර්ථිකය කොවිඩ් - 19 වසංගතය නිසා තවදුරටත් දුබල වී ඇත. එම වසංගතය ශ්‍රී ලංකාව මත ඇති කෙරෙන බලපෑම ශ්‍රී ලංකාවේ තත්ත්වය මත පමණක් නො ව ශ්‍රී ලංකාවේ තීරණාත්මක වෙළෙඳ පොළවල් පිහිටි ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය හා චීනයේ තත්ත්වය මත ද රඳා පවතී.
- මෙම වසංගතය ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම් පෞද්ගලික පරිභෝජනය හා ආයෝජනය මත කරනු ලබන අයහපත් බලපෑම නිසා ආර්ථික වෘද්ධිය නිශේධාත්මක තත්ත්වයට පත් විය හැකි ය. ආසියානු සංවර්ධන බැංකුවේ පුරෝකථනයන්ට අනුව 2020 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 5 % කින් පමණ සංකෝචනය වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පූරෝකථනය වන්නේ 4. 5% කින් සංකෝචනය වනු ඇති බවයි.
- විදේශ විනිමය උපයා ගැනීම සඳහා අපනයන ඉපැයුම් මත රඳා සිටින අසතුටුදායක ණය බර තත්ත්වයක් සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වයක් සහිත ශුද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යසායකයන් ආර්ථිකයේ කොඳුනාරටිය සේ ක්‍රියා කරන ශ්‍රී ලංකා ආර්ථිකයට මෙම වසංගතය දැඩි බලපෑම් ඇති කරනු ඇත.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳ පොළවල් දක්නට ලැබෙන්නේ යුරෝපා සංගමය, මහා බ්‍රිතාන්‍යය හා ඇමෙරිකා එක්සත් ජනපදයේ ය. එබැවින් ගෝලීය ආර්ථික පසුබැසීම ශ්‍රී ලංකාවේ අපනයන ඉල්ලුමට ඉතා අහිතකර ලෙස බලපානු ඇත.
- ශ්‍රී ලංකාවේ ඍජු විදේශ ආයෝජන ප්‍රභවස්ථාන රටක් ලෙස චීනය මුහුණ පා ඇති ආර්ථික පසුබැස්ම අප රටේ ආයෝජන ක්‍රියාවලියට ප්‍රබල බලපෑමක් කරනු නිසැක ය. එසේ ම චීනය ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම අපනයන හා සංචාරක සේවා වෙළෙඳ පොළ. එබැවින් චීනයේ ආර්ථික පසුබැස්ම ශ්‍රී ලංකාවට විශාල ගැටලුවක් වනු ඇත.
- ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් සපයා දෙන තෙවැනි මූලාශ්‍රය වන්නේ සංචාරක කර්මාන්තය යි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක වෙළෙඳ පොළවල් වසංගතයට ගොදුරු වීමත්, සංචරණ සීමා පැනවීමත්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට දැඩි සේ බලපානු ඇත.
- ගෝලීය ඉල්ලුම පහළ වැටීමත් අවශ්‍යය කරන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ ගැටලුවටත් මුහුණ පා සිටින ලක්ෂ පහකට ආසන්න පිරිසක් සේවා නියුක්ත ව සිටින ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය ද මෙම වසංගතය නිසා අභියෝගයට ලක්වනු ඇත.
- ගෝලීය මූල්‍ය වෙළෙඳ පොළවල හට ගෙන ඇති අස්ථාවර තත්ත්වය ද ශ්‍රී ලංකාවට අයහපත් ලෙස බලපෑමට පුළුවන. ශ්‍රී ලංකාවේ ණය බර ඉහළ යාමත්, අය වැය හිගය වර්ධනය වීමත් කරන කොට ගෙන විදේශීය මූල්‍ය වෙළෙඳ පොළවලින් ණය ලබා ගැනීමේ දී අසතුටුදායක කොන්දේසිවලට යටත් වීමට සිදුවනු ඇත.

***( 2017  A / L)***

03. (iv) '' ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ජනගහනයෙන් අඩක් ම සුළු පරිමාණ ගොවියෝ වෙති.'' අඩු ඵලදායිතාව හා අඩු ආදායම් සඳහා හේතු වන දේශීය කර්මාන්තයේ ප්‍රධාන ගැටලු හඳුන්වන්න. ( ලකුණු 05)

<u>**පිළිතුරට අඩංගු විය යුතු කරුණු.**</u>

- ජල සැපයුම ප්‍රමාණවත් නො වීම. ජල කළමනාකරණය දුර්වල වීම.
- කාලගුණික හා දේශගුණික බාධක.
- පාංශු ඛාදනය වැනි හේතු නිසා පසේ සාරවත් බව හීන වීම.
- අකාර්යක්ෂම කෘෂි ව්‍යාපෘති නිසා නිෂ්පාදනයට විවිධ බාධක ඇති වීම.
- තාක්ෂණික උපකරණ භාවිතය පසුගාමී වීම.
- අලෙවිකරණය සම්බන්ධ ගැටලු.
- වනසතුන්ගෙන වන හානි.

*( 2014 A / L)*

04. (ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සේවා අංශයේ වැදගත්කම සැකෙවින් පැහැදිලි කරන්න. ( ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ඉහළ වර්ධනයක් ඇති කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද ? ( ලකුණු 05)


**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

04. (ii)
1. දළ දේශීය නිෂ්පාදිතයට ඉහළම දායකත්වයක් ලබා දීම.
2. සේවා නියුක්තිය ඉහළ දායකත්වයක් ලබාදීම.
3. ධන බාහිරතා ජනනය වීම.
4. යටිතල පහසුකම් සැපයීම.
5. ස්වාභාවික සම්පත් භාවිතය අඩු බැවින් තිරසාර සංවර්ධනය හිතකර වීම.

(iii)
1. බලශක්ති ප්‍රභවයන් විවධාංගීකරණය කිරීම හා පිරිවැය අවම කිරීම.
2. ශ්‍රම වෙළෙඳ පොළ දෘඩතා ඉවත් කිරීම.
3. ප්‍රාග්ධන සම්පාදන මූලාශ්‍ර සුලභ කිරීම හා ඒවායේ පිරිවැය අවම කිරීම.
4. විදේශ සෘජු ආයෝජන දිරි ගැන්වීම.
5. තාක්ෂණය දියුණු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම ලබාදීම.
6. කුඩා හා මහා පරිමාණ කර්මාන්ත සඳහා බදු සහන හා දිරි ගැන්වීම් ලබා දීම.
7. ගෝලීය වෙළෙඳ පොළට ප්‍රවේශ වීම සඳහා දිරිගැන්වීම් ලබාදීම.
8. ව්‍යවසායකත්ව දිරි ගැන්වීම් හා සංවර්ධනය.

## 02. යටිතල පහසුකම් සංවර්ධනය.

රටක නිෂ්පාදන හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා ජනතාවගේ ජීවන තත්තවය වැඩි දියුණු කිරීමට උපස්ථම්භනය වන ප්‍රාග්ධනය යටිතල පහසුකම් යනුවෙන් හැඳීන්විය හැකිය.




යටිතල පහසුකම් සඳහා වන ආයෝජන යනු ආර්ථික කාර්යක්ෂම ව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍යය කෙරෙන සේවා හා පහසුකම් සැපයීමට භෞතික හා සංවිධාන ව්‍යුහයන් ගොඩනැගීම ය. යටිතල පහසුකම් සංවර්ධනය රටක හෝ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබිඹු කෙරෙන වැදගත් දර්ශකයකි. යටිතල පහසුකම් ආර්ථික හා සාමජයීය වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.

1. ආර්ථික යටිතල පහසුකම්.
2. සමාජ යටිතල පහසුකම්.

**ආර්ථික යටිතල පහසුකම් යනු මහා මාර්ග, ජල සම්පාදනය හා ජලාපවහනය, සන්නිවේදන පහසුකම් ජාල යනාදිය යි.**

**සමාජ යටිතල පහසුකම් යනු පාසල්, විශ්වවිද්‍යාල, රෝහල්, නිවාස සංවර්ධනය යනාදිය යි.**

යටිතල පහසුකම් සංවර්ධනයට කරනු ලබන ආයෝජන ආර්ථික වෘද්ධියට විවිධාකාරයෙන් බලපායි.

යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම රටක සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණ දෙන ප්‍රධාන බාධකයකි. අසතුටුදායක මාවත්, වාහන තදබදය, කෙටි දුරක් ගමන් කිරීමට බොහෝ කාලයක් ගතවීම, යනාදිය සංවර්ධන ක්‍රියාවලියේ දී බෙහෙවින් බලපාන සාධක වේ. මහා මාර්ග, පාලම්, වරාය, දුම්රිය මාර්ග, සන්නිවේදන ජාල, වාරිමාර්ග පහසුකම් සංවර්ධනය කිරීම ආර්ථික වෘද්ධියට බෙහෙවින් උපකාරී වේ.

යටිතල පහසුකම් සංවර්ධනය වී ඇති විට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ ඒවා බෙදා හැරීම ඉතා පහසුවෙන් හා කාර්යක්ෂම ව කළ හැකි ය.

මෑත දී කරන ලද පර්යේෂණයකට අනුව හෙළි වී ඇත්තේ යටිතල පහසුකම් ඉහළ යන සෑම 10% ක් පාසා ම දිගුකාලීන නිමැවුම 1% කින් වර්ධනය වන බවයි.

## යටිතල පහසුකම් ආර්ථික හා සමාජයීය වශයෙන් වැදගත්වීමට හේතු.

1. ඵලදායිතාව ඉහළ යාම.
2. ආර්ථික වෘද්ධිය වේගවත් වීම.
3. ආයෝජකයින් ආකර්ෂණය කිරීමට පිටිවහල් වීම.
4. ආයෝජකයිනගේ පෞද්ගලික පිරිවැය අඩු වීම.
5. අපතේ යාම් හා නාස්තිවීම් අවම වීමට ඉවහල් වීම.
6. කළමනාකරණය හා සම්බන්ධීකරණය කාර්යක්ෂම වීම.
7. ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු වීමට ඉවහල් වීම.
8. සමාජ සංවර්ධනයට හේතු වීම.
9. මානව ප්‍රාග්ධනය බිහිවීමට හේතු වීම.
10. ආර්ථිකයේ තරගකාරීත්වය ඉහළ යාම.

## යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රවේශ වන මූලාශ්‍ර.

a. යටිතල පහසුකම් සඳහා රජයේ ආයෝජන.
b. යටිතල පහසුකම් සඳහා ස්වේච්ඡා ආයෝජන.
c. යටිතල පහසුකම් සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය. ( PPP )

## a. යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන.

- ශ්‍රී ලංකාවෙ යටිතල පහසකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 5 % කට ආසන්න වේ.
- නමුත් ආර්ථිකයේ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහාත් ආර්ථික වෘද්ධියේ උපරිම මට්ටමට ළඟා වීම සඳහාත් විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කිරීම සඳහාත් යටිතල පහසුකම් සංවර්ධනයේ ආයෝජන තවදුරටත් ඉහළ නැංවීමේ අවශ්‍යතාව පවතී.
- ඒ සඳහා ප්‍රබල බාධාවක් වන්නේ රාජ්‍ය ආදායම් සීමිත වීම, රාජ්‍ය ණය ඉහළ අගයක් ගැනීම, රාජ්‍ය ණය ආපාසු ගෙවීමේ හැකියාව සීමිතවීම යනාදිය යි.
- මේ තත්ත්වය යටතේ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය තුළින් යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම වැදගත් වේ.

❖ කොවිඩ් - 19 නව වෛරස ප්‍රභේධයේ ව්‍යාප්තියත් සමඟ ජනතාවගේ සමාජ ආර්ථික යහ පැවැත්ම සඳහා හා ආර්ථික කටයුතු පවත්වා ගෙන යාම සඳහා සමාජ හා ආර්ථික යටතල පහසුකම් පද්ධතිය අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට කටයුතු කළේ ය.

❖ ලෝක වෙළෙඳ පොළේ බලශක්ති මිල ගණන් ඉහළ යාම, නැගෙනහිර යුරෝපා කලාපයේ ඇති වූ දේශපාලනික අර්බුද, බලශක්ති ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රධාන ව්‍යවසාය වන ඛනිජ තෙල් නීතිගල සංස්ථාවේ මූල්‍ය මට්ටම දුර්වල තත්ත්වයක පැවතීම, විදේශ විනිමය ගලා ඒම දුර්වල වීම යන කරුණු නිසා රටේ බලශක්ති අර්බුදයක් නිර්මාණය කළේ ය. මෙම තත්ත්වය ආර්ථිකය යළි නැගිටීමේ ප්‍රයත්නයට අහිතකර බලපෑමක් ඇති කරයි.

❖ සමාජ ආර්ථික යටිතල පහසුකම්වල වැදගත්කම අවබෝධ කර ගනිමින් ග්‍රාමීය හා නාගරික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ කටයුතුවල නිරත විය. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය දියත් කිරීම, ඛනිජ තෙල් සම්පත් ගවේෂණය, අපද්‍රව්‍යය බලශක්තියට හැරවීමේ පළමු ව්‍යාපෘතිය කෙරවලපිටියෙන් ආරම්භ කිරීම, මධ්‍යම අධිවේගී මාර්ගයේ සිව්වන අදියර විවෘත කිරීම, නව කැලණි පාලම විවෘත කිරීම ආදිය 2021 වර්ෂයේ සිදු කළ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වේ.

❖ කොවිඩ් - 19 වසංගතය ආරම්භයේ සිට ම පරීක්ෂණ පහසුකම් සැපයීම, ප්‍රතිකාර හා නිරෝධායන පහසුකම් ඇති කිරීම, කොවිඩ - 19 එන්නත හා වර්ධක මාත්‍රා ලබා දීම යනාදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සැපයීමේ දී ප්‍රධාන විය.

❖ රටේ විදුලි සන්දේශන අංශයේ සහයත් සමඟ අධ්‍යාපන ක්ෂේත්‍රය මාර්ගගත අධ්‍යාපන ක්‍රමවෙදයකට හුවමාරු වූ අතර එහි දී තාක්ෂණික උපාංගවල හිගය, ඒ ආශ්‍රිත සාක්ෂරතාව අඩු මට්ටමක පැවතීම, දුර්වල අන්තර්ජාල පහසුකම් පැවතීම යන ගැටලු තවදුරටත් විසඳීය යුතු ව ඇත.

❖ රාජ්‍ය මූල්‍ය අවකාශය අඩු මට්ටමක පැවතිය ද කොවිඩ් - 19 පළමු අදියරේ හා දෙවන අදියරේ දී වසංගතය නිසා අවදානමට ලක්වූ පවුල් වෙනුවෙන් සහන දීමනා ලබා දීමට රජය පියවර ගත්තේ ය.

## b. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ස්වේච්ඡා ආයෝජන.

❖ මෙහි දී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පෞද්ගලික අංශය දිරි ගැන්වීමට ලෝක බැංකුවේ සහ USAID ආයතනයේ සහය ඇති ව මුදල් අමාත්‍යාංශය තුළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2017 ජනවාරි මාසයේ දී අමාත්‍යාංශ අනුමැතිය හිමි විය.

❖ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව දිරි ගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව මඟින් දේශපාලනඥයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ දැනුම්වත් බව ඉහළ නැංවිය යුතු අතර පෞද්ගලික ආයෝජන දිරිගැන්වීම සහ සේවාවල ගුණාත්මක බව සහ සාධාරණ මිල ගණන් සහතික කිරීමට සුදුසු නියාමන හා පරිපාලන යාන්ත්‍රණයක් නිර්මාණය කළ යුතු ය.

❖ ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල පෞද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා,

- ස්ථාවර ප්‍රතිපත්ති,
- යහපාලනය,
- විනිවිද භාවය.
- ආයතනික හැකියා වර්ධනය.
- ඵලදායිතා නියමයන් හා කාර්යක්ෂම මූල්‍ය වෙළෙඳ පොළ.

  අවශ්‍යය වේ.

❖ මේ අතර කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීම තහවුරු කිරීම සඳහා ආර්ථිකයට වැඩි ප්‍රතිලාභ හිමි වන අයුරෙන් ව්‍යාපෘතිවල ප්‍රමුඛතා අනුපිළිවෙළ හඳුනා ගැනීමට යටිතල පහසුකම් ව්‍යාපෘති පුළුල් ශක්‍යතා අධ්‍යයනයකට ලක්කළ යුතු ය.

## c. යටිතල පහසුකම් සංවර්ධනයෙහිලා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය.

❖ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සාර්ථක ක්‍රමවේදයකි. මෙහිදී තමන්ට වඩාත් හොඳින් කළ හැකි කාර්යයන් ඒ ඒ පාර්ශවයන් විසින් තෝරා ගෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු ය.

- ❖ ව්‍යාපෘති නිම කිරීමට ගනවන කාලය කඩිනම් කරමින් ප්‍රමාද වීම වළක්වා ගත හැකිය. කාර්යය සාධනය මනිනි දර්ශකයක් ලෙස ව්‍යාපෘති නිම කිරීමට ගතවන කාලය සැලකිය හැකි ය.
- ❖ තනිකර ම රාජ්‍ය අංශය හෝ පෞද්ගලික අංශය හෝ ඉටු කරන වයපෘතියකට වඩා ඉහළ ආයෝජන ලාභ අනුපාතිකය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති මඟින් අත්කර ගත හැකිය. දෙපාර්ශවය ම එක් ව ක්‍රියා කරන විට සැලසුම් කිරීම හා මූල්‍යනය යන කරුණු සලකා නව්‍ය ක්‍රමවේද යොදා ගැනීමට හැකියාව ලැබේ.
- ❖ ව්‍යාපෘතියක අවදානම් සියල්ල ඇගයීමට ලක්කර එහි ශක්‍යතාව තීරණය කරනු ලැබේ. හුදෙක් රජයේ හෝ දේශපාලනික අවශ්‍යතා සහ වෙනත් අභිලාෂයන් මත ශක්‍යතාවකින් තොර ව ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කරනු ලැබුවහොත් පෞද්ගලික අශය එවැන්නක් කිරීමට එකග නො වේ.
- ❖ පිරිවැය පාලනය කිරීමෙහි ලා වඩා පළපුරුද්ද හා අත්දැකීම් ඇති පෞද්ගලික අංශයවෙත ව්‍යාපෘති මෙහෙයවීමට ක්‍රියාවට නැංගීමේ අවදානම් පැවරීමට රජයට අවස්ථාව සැලසේ.
- ❖ බොහෝ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති තුළ කල්තබා ව්‍යපෘති නිම කිරීම වෙනුවෙන් ලබා දෙන ප්‍රසාද දීමනා ඇතුළත් වන බැවින් සියලු ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂම ව නිම කිරීමට හැකියාව ලැබේ.
- ❖ රජයේ අරමුදල් වඩා කාර්යක්ෂම ලෙස වැය කිරීමට මේ යටතේ ඉ ඩසැලසෙන බැවින් සාමජ ආර්ථික වැදගත්කමකින් යුතු වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි සීමිත රාජ්‍ය අරමුදල් යොමු කිරීමට අවස්ථාව සැලසේ.
- ❖ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව සහිත ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව වැඩි බැවින් එය රාජ්‍ය මූල්‍යයට වාසිදායක ය.
- ❖ ව්‍යාපෘති ජීවන චක්‍රයේ සෑම අදියරක දී ම ඉහළ ප්‍රමිති මට්ටමක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබෙනු ඇත.
- ❖ රාජ්‍ය වියදම් අඩු කර ගැනීමට ඉඩ සැලසෙන බැවින් ජානතාව මත බදු බර ද අඩු විය හැකිය.
- ❖ පෞද්ගලීකරණ ක්‍රමවේදයන්ට සමාජයේ දැඩි විරෝධයක් පවතින විට එයට සාර්ථක ව මුහුණ දිය හැකි විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය පෞද්ගලීකරණ හවුල්කාරීත්ව ව්‍යාපෘති හඳුන්වා දිය හැකිය.

## <u>පසුගිය විභාග ප්‍රශ්න</u>

***( 2020 A / L ( OLD ) )***

01. (i) යටිතල පහසුකම් යනු කුමක් ද? එය ආර්ථික වෘද්ධියට දායක වන්නේ කෙසේ ද? ( ලකුණු 05)

***( 2017 A / L)***

02. (i) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා යොදා ගත හැකි උපාය මාර්ග වශයෙන් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයේ වාසි ( ***PPP***) කවරේ ද? ( ලකුණු 05)

***( 2014 A / L)***

03. (iv) මෑත කාලීන ව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන යටිතල සංවර්ධන ව්‍යාපෘති කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 05)

***( 2012 A / L)***

04. (iv) '' දිවි නැගුම '' වැටසටහනෙහි ප්‍රධාන ලක්ෂණ සැකෙවින් විස්තර කරන්න. ( ලකුණු 05)

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

කුටුම්බවලට තමන්ගේ එදිනෙදා පරිභෝජනයට අවශ්‍යය කරන එළවළු සහ පලතුරු තම ගෙවත්තේම නිපදවා ගැනීමටත්, දෛනික ආහාර අවශ්‍යතා සඳහා වෙළෙඳ පොළ මත රඳා පැවැත්ම අඩු කිරීමත්, කුටුම්බයේ මූල්‍යමය සුරක්ෂිතතාව ඉහළ නැංවීමටත් අරමුණු කර ගනිමින් 2011 අයවැය ලේඛනයෙන් දිවි නැගුම වැඩසටහන හඳුන්වා දෙන ලදී.
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාමක කරන මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු කිහිපයකි.

1. කුටුම්බයේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.
2. කුටුම්බයේ ජීවන වියදම් පහළ දැමීම.
3. එළවළු හා පලතුරු නිෂ්පාදන 25% කින් වැඩි කිරීම.
4. ප්‍රතිශීර්ෂ එළවළු පරිභෝජනය දිනකට 134 Kg සිට 175Kg දක්වා වැඩි කිරීම.
5. අතිරික්ත නිෂ්පාදනය අලෙවි කර අතිරේක ආදායමක් උපයා ගැනීම.

2011 මාර්තු මාසයේ දී ආරම්භ කළ මෙම වැඩසටහන ප්‍රථම වටය යටතේ පවුල් මිලියනයක් සවිබල ගැන්වීමට සැලසුම් කරන ලදී ග්‍රාම නිලධාරී වසමකට පවුල් 100ක් බැගින් තෝරා ගනු ලැබිණි.

ගෙවතු සැකසීම. එළවළු හා පලතුරු වගාව, පරිසිර හිතකාමී වාතාවරණයක් ගොඩනැගීම, ගෘහස්ථ කර්මාන් ඇරඹීම මේ යටතේ අපේක්ෂා කෙරිණි.

රජය විසින් පොහොර මා බීජ සපයන ලද අතර පොල් පැළ, පලතුරු පැළ හා ඖෂධ පැළ බෙදා දීම කුකුළු පැටවුන් ලබාදීම මේ යටතේ සිදු කෙරිණි.

2011 ඔක්තෝම්බර් මාසයේ දී ආරම්භ කරන ලද දෙවන වටය යටතේ ගෘහ කර්මාන්ත, ස්වයං රැකියා, ධීවර හා සත්ත්ව පාලනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණි.

මේ වන විට නිවාස මිලියන 2.5 ක් දිවි නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. කිලිනොච්චිය හැර අන් සියලු දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ.

***( 2010 A / L)***

05. (i) '' ගැමිදිරිය '' ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය ව්‍යාපෘතියේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න.

( ලකුණු 05)

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

ශ්‍රී ලංකාවේ තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක ( බදුල්ල, මොනරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර හා පොළොන්නරුව) දිළිඳුකර පිටුදැකීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ ආරම්භ කරන ලද ප්‍රජා සහභාගීත්ව වැඩසටහනකි.

ප්‍රජා සහභාගීත්වය හා ගැමි ප්‍රජාව සවිබලකරණය කිරීම මඟින් ග්‍රා සංවර්ධන කටයුතු සැලසුම් කර තිරසාර සංවර්ධනයක් පවත්වා ගෙන යාම පිණිස වඩාත් යෝග්‍ය ග්‍රාම සංවර්ධන ආකෘතියක් මඟින් දිළඳුකම අවම කිරීමට මෙමඟින් කටයුතු කෙරිණි.

ප්‍රජා පාලිත ග්‍රාම සංවර්ධන ප්‍රවේශයක් අනුව ගමේ සමීක්ෂණයක් සිදු කර ගමේ අවශ්‍යතා හඳුනා ගෙන ගමේ සංවර්ධන සැලැස්ම ගමේ ප්‍රජාව විසින් ම බැහැරින් අවශ්‍යය සහය පමණක් ලබා ගෙන සකස් කරනු ලැබේ.

දිළඳුකම හා ප්‍රජාවගේ ප්‍රකාශිත කැමැත්ත මත ස්වං තේරීමේ ක්‍රියාවලියකින් තෝරා ගත් ගම්වල ජනතා සංවිධනයක් පිහිටුවා ගැනේ. එම සංවිධානය ගමේ පවුල්වලින් 80% කට වඩා වැඩි කැමැත්තකින් පිහිටුවා ගැනේ. එය සමාගම් පනත යටතේ ලියාපදිංචි කෙරේ.

ගමේ සංවර්ධන සැලැස්ම ගමේ පවුල්වලින් 80% කට වඩා වැඩි සංඛ්‍යාවක හා එම පිරිසෙන් 50% කට වඩා වැඩි කාන්තාවන් සංඛ්‍යාවක සහභාගීත්වයෙන් පවත්වනු ලබන මහා රැස්වීමක දී අනුමත කොට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය මුදල් ගැමිදිරිය පදනම මඟින් සෘජුව ම ජනතා සමාගමට ලබා දේ.

ගමේ මූලික අවශ්‍යතා ඉටුවන යටිතල පහසුකම් සැපයෙන ව්‍යාපෘති යෝජනා ප්‍රජාව විසින් 10% ක මූල්‍ය දායකත්වයක් හා 20% ක ශ්‍රම දායකත්වයක් ලබා දීමට එකඟ වී මහා සභාවේ දී අනුමත කරගනු ලබන අතර අදාළ ව්‍යාපෘති යෝජනා තාක්ෂණික, සමාජයීය හා පාරිසරික වශයෙන් ඇගැයීමට ලක් කර ඒවායේ නඩත්තුව ප්‍රජාව විසින් ම සිදු කරනු ලබන වැඩ පිළිවෙළක් පිළිබඳ ව සෑහීමකට පත් වීමෙන් පසුව ජනතා සමාගමට අරමුදල් සෘජු ව ම ලබා දෙනු ලැබේ.

ප්‍රජා සංවර්ධනය හා ජීවන මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා ස්වං තීරණ ගැනීම, සැලසුම්කරණය, සම්පත් මෙහෙය වීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගැයීම පෙරදැරි කරගත් ප්‍රයත්නයක් කරා යොමු වූ ආයතනික් ව්‍යුහයක් පිහිටුවා ශක්තිමත් ව පවත්වා ගෙන යාම පිණිස ග්‍රාමීය ප්‍රජාව සවිබල ගන්වනු ලැබේ.

ගමේ දිළිඳු ජනතාව මුළුමනින් ම කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වී ඉතුරුම් හා ණය ක්‍රියාවලිය පිළිබඳ ව මනා පුහුණුවක් ලබා ගමේ ඉතුරුම් ගමේ ආර්ථිකයට ආයෝජනය කිරීමට ඉඩ ලැබෙන පරිදි ඉතුරුම් හා ණය අරමුදලක් පිහිටුවා ගෙන ඇත.

## 03. සංචාරක කර්මාන්තය.

❖ ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයක් වන සංචාරක කර්මාන්තය අඛණ්ඩ ව වර්ධනය වීමේ ප්‍රවණතාවක් පෙන්වයි. ඉතිහාසයෙ ප්‍රථම වතාවට මිලියන දෙකෙහි සන්ධිස්ථානය පසුකරමින් 2016 වර්ෂයේ දී සංචාරක පැමිණීම 2 050 832 දක්වා 14% ක කැපී පෙනෙන වාර්ෂික වර්ධනයක් වාර්තා කළේ ය.


❖ සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා උපයෝගී වූ සාධක කිහිපයකි.

1. සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කළ ආයෝජන ඉහළ යාම.
2. නව ගුවන් සේව, මඟී නෞකා සේවා ක්‍රියාත්මක වීම.
3. ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක වීම.
4. ලෝකයේ ප්‍රධාන සංචරක ගමනාන්තවල භූගෝලීය, දේශපාලනික අවිනිශ්චිතතා වර්ධනය කිරීම.

❖ අප්‍රිකානු කලාපය හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලෙන් ම සංචාරකයන් පැමිණීම වර්ධනය විය. ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණෙන විශාලතම සංචාරක කලාපය බටහිර යුරෝපය යි. 2016 වර්ෂයේ දී මෙම කලාපයෙන් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 64 333කි.

❖ රටෙහි නැගෙනහිර හා උතුරු පළාත්වල සංචාරක කර්මාන්තයේ ඉහළ විභවයක් උකහා ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ අවධානය යොමුවීමත් සමඟ එම පළාත්වල සංචාරක කර්මාන්තයේ අඛණ්ඩ වර්ධණයක් සිදුවිය.

❖ පසුගිය වසර කිහිපය තුළ ප්‍රබල ප්‍රවර්ධන වැඩසටහන් හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ගන්නා ලද පියවර මෙරටට විදේශ සංචාරකයින් ආකර්ෂණය කරගැනීමට උපකාරී වුව ද ශ්‍රී ලංකාව තවමත් ගෝලීය වෙළෙඳ පොළ තුළ තම පූර්ණ විභවතා ළඟා කරගෙන නොමැත.




❖ කොවිඩ් - 19 වසංගතයෙන් පීඩාවට පත් වූ සංචාරක කර්මාන්තය 2021 අගභාගයේ දී ස්ථාවර ප්‍රගතියක් අත් කර ගත්තේය. 2021 ජනවාරි මාසයේ දී රට නැවත විවෘත කිරීම නිසා ආර්ථික කටයුතු හා සංචාරක සීමා කිරීම් නොතකා සංචාරකයින්ගේ ස්ථාවර වැඩිවීමක් දැකිය හැකි විය.

❖ වසංගතයේ තුන්වන රැල්ල හිස එසවීම නිසා 2021 වර්ෂයේ අප්‍රේල් මාසයේ සංචරණ සීමා පැනවීම නිසා නැවතත් සංචාරක කර්මාන්තයට දැඩි පීඩාවක් එල්ල වූ නමුත් පූර්ණ එන්නත්කරණයට ලක්වූ සංචාරකයින්ට රටතුළට පැමිණීමට අවසර ලැබීමත් සමඟ 2021 දෙසැම්බර් මාසය වන විට සංචාරක කර්මාන්තයේ යළි පිබිදීමක් දැකිය හැකි විය. 2020 වර්ෂයේ සංචාරකයින්ගේ මුළු පැමණීම 507 704ක් වූ අතර එම ප්‍රමාණය 2021 වර්ෂයේ දී 194 495ක් දක්වා 61. 7% කින් පහළ ගියේ ය.

❖ යුරෝපා කාලපය මෙරටට සංචාරක පැමිණීමේ ප්‍රමුඛ කලාපය වන අතර එය මුළු සංචාරක පැමිණීමේ 48 % කි. තනි රටක් ලෙස ඉන්දියාව මුල් තැන ගනී. එම ප්‍රමාණය 2021 වර්ෂයේ දී 56 268ක් විය. රුසියාව යුරෝපයේ වැඩිම සංචාරකයින් ලංකාවට පැමිණෙන රට ලෙස 2021 වර්ෂයේ දී පත්වූ අතර ඒ සඳහා රුසියාවේ සිදු කළ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ඉවහල් විය.

❖ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම් සහ රැඳී සිටින කාලය යන ද්විත්වයෙහි ම ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර සංචාරකයින් පැමිණීමේ අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස 2020 වසරට සාපේක්ෂව 2021 වර්ෂයේ දී සංචාරක ඉපැයීම් සුළු වශයෙන් පහළ ගියේ ය.

- 2021 වර්ෂයේ දී සංචාරක අංශය සඳහා වූ ආයෝජන තවදුරටත් පුළුල් වූ අතර ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ විභව පිළිබඳ ආයෝජකයන් සතු අඛණ්ඩ විශ්වාසය මෙයින් තහවුරු වේ.
- සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය හා පෞද්ගලික අංශය ඒකාබද්ධ ව 2021 වර්ෂයේ දී විවිධ ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් දියත් කළේ ය.

    1. වාණිජ බැංක හා විශේෂිත කල්බදු සමාගම් සංචාරක ක්ෂේත්‍රයට අදාළ ව ලබාදුන් ණය සහන කාලය 2021 ඔක්තොම්බර් මස දක්වා දීර්ඝ කිරීම.
    2. සංචාරක අංශයේ නියතු පුද්ගලයින් හා ව්‍යාපාර සඳහා ''සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද ණය පහසුකම '' ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වා දීම.
    3. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සහය ඇති ව ලියාපදිංචි සියලුම සංචාරක මඟ පෙන්වන්නන් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.
    4. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2021 වර්ෂයේ සිට පස් අවුරුදු ගෝලීය සංවර්ධන වැඩසටහනක් දියත් කළේ ය. ඒ අනුව 2021 වර්ෂයේ දී ඉන්දියානු සිනමාව ඉලක්ක කර චිත්‍රපට ආශ්‍රිත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය ආරම්භ කළේ ය. එමෙන ම 2021 වර්ෂයේ දී ඩුබායිහි පැවැත්වූ World Expo 2020 ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාවෙ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලදී.

## වර්තමානයේ ආර්ථිකය සඳහා සංචාරක ඉපැයීම්වල වැදගත්කම.

සංචාරක කර්මාන්තය 2014 හා 2019 වර්ෂ අතර ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම්වලින් තෙවන ස්ථානය හිමි කර ගෙන ඇත. එය මෙම කාලපරිච්ඡේදයේ මුළු විදේශ ඉපැයීම්වලින් 14% විය. කෙසේ වෙතත් සිචාරක කර්මාන්තය තනි කර්මාන්තයක් වශයෙන් යෙදවුම් ආනයන මත අඩු රඳා පැවැත්මක් සමඟ සැලකිය යුතු විදේශ විනිමය ඉපැයීමක් උත්පාදනය කිරීමට සමත් වී ඇත.

ගෝලීය සංචාරක කර්මාන්තය මෑත දශක කිහිපය තුළ කාලානුරූපීව ගෝලීය මූල්‍ය අර්බුදයටත් වසංගත තත්ත්වයටත් ගොදුරු වුව ද ස්ථාවර වර්ධනයක් වාර්තා කළේ ය. ශ්‍රී ලංකාව ද තිස් වසරක සිවිල් යුද්ධය නිමාවට පත් කරමින් 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සංචාරක පැමිණීම්වල අඛණ්ඩ වර්ධනයක් වාර්තා කළේ ය. මේ නිසා ම කීර්තිමත් සංචාරක තොරතුරු මූලාශ්‍රයක් වන Lonely Planet ආයතනය 2019 වර්ෂය සඳහා ලෝකයේ හොඳම සංචාරක ගමනාන්තය ශ්‍රී ලංකාව ලෙස නම් කළේ ය. නමුත් 2019 වර්ෂයේ අප්‍රේල් මාසයේ ඇති වූ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයත් සමඟ සංචාරක පැමිණීම පසුගාමී විය. නමුත් 2019 වර්ෂාවසානයේ හා 2020 වර්ෂය ආරම්භයේ සංචාරක පැමිණීම නැවතත් යථා තත්වයට පත් විය. 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ නැවතත් සංචාරක කර්මාන්තය පසුගාමී විය.
සංචාරක කර්මාන්තයේ වැදගත්කම හඳුනා ගනිමින් කොවිඩ් - 19 වසංගත සමයේ ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය ණය සහන දීමනා, ගාස්තු නිදහස් කිරීම්, විදුලි බිල්පත් සහන, ප්‍රදාන හා බදු සහන, වැනි ක්‍රියා මාර්ග රාශියක් ගත්තේ ය. එමෙන් ම 2022 වර්ෂයේ ජනවාරි මාසයේ දී අනේවාසිකයන් විදේශ ව්‍යවහාර මුදලින් පමණක් ගෙවීම් ලබාගත යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩය සංචාරක සේවා සපයන්නන්ට දැනුම් දුන්නේ ය. එමෙන් ම වසංගත සමයේ නිරෝධායන මධ්‍යස්ථාන ලෙස සංචාරක හොටල් පවත්වා ගනිමින් කුඩා පරිමාණයේ හොටල් හිමියෝ තම ව්‍යාපාර පවත්වා ගත්හ.

## ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන ගැටලු.

1. සංචාරක ක්ෂේත්‍රයේ නියැලුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශ රටවල සේවයේ යෙදී සිටී. සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනිම සඳහා සේවක පුහුණු කිරීම් රජයට සිදු කිරීම අපහසු බැවින් ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයක් අවශ්‍යය වේ.
2. ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නො වීම. බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් ව්‍යාපාර තවමත් ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කර නැත. ෆොබ්ස් සඟරාව නම් කර ඇති ලොව හොඳ ම අන්තර්ජාතික සුඛෝපභෝගී හොටල් දාම සන්නාම දහයක් අතුරෙන් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ තුනක් පමණි.

3. සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද කර්මාන්ත තුළ සැලකිය යුතු අවිධමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය වේ. නොවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව හා ආචාර ධර්ම වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍යය වන අතර එසේ කිරීමට අපොහොසත් වීම රටේ යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතු වේ.

4. විශාල විභවතාවක් සහිත චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ පැමිණීම වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීමේ ඇති හැකියාව වර්ධනය කිරීම සංචාරක කර්මාන්තයේ දැනට පවතින අභියෝගයකි. එහි දී චීන භාෂාවෙන් විකාශනය වන ගුවන් විදුලි නාලිකා, චීන භාෂාවෙන් කථා කරන සංචාරක මඟ පෙන්වන්නන් ආදිය අවශ්‍යය වේ.

5. සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව වසර ගණනාවක් පුරා එක ලෙස ම පැවතීම තවත් අභියෝගයකි. මෙහි දී ප්‍රධාන වශයෙන් සංචාරකයන් සඳහා පවතින ක්‍රියාකාරකම් අඩුවීම නිසා සංචාරකයෙකු නැවතී සිටින කාලසීමාව රාත්‍රී 10ක් ලෙස නො වෙනස් ව පවතී. මෙහි දී මගී නෞකා සාමුද්‍රික සංචාර, විවේකය අරමුණු කර ගත් සංචාර, විනොදාස්වාදය අරමුණු කරගත් සංචාර වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

6. තොතුරු ලබා ගැනීම සඳහා පමණක් නො ව කුලී රථ හා හෝටල් වෙන් කිරීම, ජංගම දුරකථන සම්බන්ධතා , වයිෆයි සම්බන්ධතා, සංචාරක සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයන්ට සේවා සපයන්නා වූ බහු කාර්යය තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි කිරීම කළ යුතු ය.

7. සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළු ව සංචාරක කර්මාන්තයේ නියුතු සියලු ම පාර්ශවකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍යය වන අතර එමගින් වඩා සහසම්බන්ධතාවයෙන් යුතු ඉහළ මට්ටමේ ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීමට ඉඩ සැලසෙනු ඇත.

## ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ඉදිරි දැක්ම.

1. සංචාරක කර්මාන්තයේ නව අවස්ථා හඳුනා ගැනීම. පුද්ගල සුවතාව හා සබැඳුණු සංචාරක කර්මාන්තය, අධ්‍යාපන හා සබැඳුණු සංචාරක කර්මාන්තය, පරාර්ථකාමීත්වය හා සැබැඳුණු සංචාරක කර්මාන්තය, වැනි සංචාරක ක්ෂේත්‍රයේ නව වපසරීන් හඳුනා ගෙන ඒ සඳහා සේවා පුළුල් කිරීම.
2. ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම සහ පරිසර දූෂණය අවම කිරීමේ වැදගත්කම.
3. සංචාරකයින්ගේ ගමන් මඟ කෙරෙහි අවධානය යොමු කිරීම.
4. ඩිජිටල් තාක්ෂණය වැඩි වශයෙන් භාවිත කිරීම.
5. වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කර සංචාරක ව්‍යාපාරයේ විභවය ප්‍රයෝජනයට ගැනීම සඳහා තොරතුරු වැඩි දියුණු කිරීම.
6. සංචාරක කර්මාන්තයේ අවදානම් කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීම.
7. සංචාරක කර්මාන්ත තුළ අවිධිමත් උප අංශය අඩු කිරීම.
8. සංචාරකයින් අතර විවිධත්වය දියුණු කිරීම.
9. සංචාරක ව්‍යාපාරය මත දැඩි ලෙස රඳා පැවතීම අඩු කිරීම.

## <u>පසුගිය විභාග ප්‍රශ්න</u>

*( 2017 A / L)*

01. (iii) '' සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වේගවත් ව වර්ධනය වන ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ.'' විදේශ විනිමය ඉපැයීම් හා සේවා නියුක්තියට සංචාරක කර්මාන්තයේ මෑත කාලීන දායකත්වය පෙන්වා දී, එම කාර්මාන්තය වර්තමානයේ මුහුණ දී ඇති අභියෝග සාකච්ඡා කරන්න. ( ලකුණු 05)

*( 2013 A / L)*

02. (iii) ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීමේ දී මෙරට සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග කවරේ ද? ( ලකුණු 05)

## 04. දැනුම් ආර්ථිකය.

- දැනුම් ආර්ථිකය යනු බුද්ධිමය ප්‍රාග්ධනය මත පදනම් වූ පාරිභෝජන හා නිෂ්පාදන ක්‍රියාවලියකි. දැනුම් ආර්ථිකය සාමාන්‍යයෙන් සංවර්ධිත රටවල සියලු ආර්ථික ක්‍රියාකාරකම්වල විශාල කොටසකි. දැනුම් ආර්ථිකය තුළ ස්වාභාවික වටිනාකම්වලින් සැලකිය යුතු කොටසක් අශ්පෘෂ්‍යය වත්කම්වලින් සමන්විත වන අතර එහි සේවක දැනුම් වටිනාකමක් ඇතත් සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් මූලධර්ම අනුව මෙම වත්කම් ශේෂ පත්‍රවල ඇතුළත් කිරීමට ඉඩ නොදේ.
- ඌන සංවර්ධිත රටවල් කෘෂිකර්මාන්තය හා නිෂ්පදන ආර්ථිකය පදනම් කර ගෙන සිටින අතර දියුණු වෙමින් පවතින රටවල නිෂ්පාදනය හා සේවා පාදක ආර්ථිකයක් ද වර්ධනය වී ඇත් අතර සංවර්ධිත රටවල සේවා ආර්ථිකය පදනම් කර ගෙන ඇති බව පෙනේ.
- තොරතුරු යුගයේ දී ගෝලීය ආර්ථිකය දැනුම් ආර්ථිකය වෙත යොමු විය. තොරතුරු යුගයට මෙම සංක්‍රමණ ඇතුළත් වන්නේ සේවා කාර්යක්ෂම, නිෂ්පාදන කාර්යක්ෂම හා ශ්‍රම සූක්ෂම ආර්ථික වර්ධනයන්ගෙන් ලබා ගන්නා ලද හොඳ ම භාවිතයන් ය. දැනුම් හා දැනුම් පදනම් කරගත් සාධක එකතු කර ඇති අන්තර් සම්බන්ධතා සහ ගෝලීය ආර්ථිකය සඳහා ප්‍රවේශ වන දැනුම් හා රහස් ආර්ථික වර්ධනයේ තීරණාත්මක සාධකයක් වන අතර ආර්ථික සම්පතක් ලෙස ද වැදගත් වේ.
- දැනුම හා අධ්‍යාපනය යනුවෙන් හඳුන්වන මානව ප්‍රාග්ධනය ඵලදායී වත්කමක් ලෙස හෝ ව්‍යාපර නිෂ්පාදනයක් ලෙස හෝ යොදා ගන්නා ආකාරය පිළිබඳ ව අවධානය යොමු කරයි. නිෂ්පාදිත පරිභෝජනයට හෝ අපනයනය සඳහා හෝ යොදා ගත හැකි අතර මානව ප්‍රාග්ධනය ව්‍යාපාර සඳහා සහ ආර්ථිකය සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට යොදා ගත හැකිය.

### දැනුම පදනම් කර ගත් ආර්ථිකය ආශ්‍රිත වැදගත් සංකල්ප.

1. දැනුම්කරුවන්.
2. දැනුම් ඉංජිනේරුවන්.
3. දැනුම් ප්‍රාග්ධනය.
4. බුද්ධිමය ප්‍රාග්ධනය.
5. බුද්ධිමය දේපොළ.

### දැනුම් ආර්ථිකයක් කරා යෑමේ අභියෝග.

1. ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතිකය පහළ මට්ටමක පැවතීම.
2. මේ නිසා අධ්‍යාපන මට්ටම පහළ මට්ටමක පවතී. මානව ප්‍රාග්ධන සමුච්චය ඉහළ ගොස් නැත.
3. පර්යේෂණ හා සංවර්ධනය සඳහා වැය කරන අරමුදල් ප්‍රමාණවත් නො වීම.
4. ශ්‍රී ලංවා තුළ පවතින අඩු නිපුණතාව හා අඩු වැටුප් පදනම් කර ගත් කාර්මීකරණ ක්‍රියාවලිය නිසා දැනුම් කේන්ද්‍රීය ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය කරා නැඹුරු වීමේ හැකියාව අඩු වී ඇත.
5. 1998 වන විට ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටක සිට මැද පහළ ආදායම් ලබන රටක් බවට පත්වීමත් සමග ශ්‍රී ලංකාවට විදේශීකයන්ගෙන් ලැබෙන ප්‍රදානයන් හා ආධාර සීමා සහිත වීම. මේ නිසා අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය අඩු වී ඇත.
6. සෘජු විදේශ ආයෝජන අඩු තාක්ෂණය සහිත ශ්‍රමසූක්ෂම කර්මාන් ත වෙත බහුල වශයෙන් ගලා ඒමා නිසා මානව ප්‍රාග්ධණ සම්පාදනය කර ගැනීමේ ඉඩ ප්‍රස්තා අඩු වීම.

### දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශක.

1. ආර්ථික සානුබල හා ආයතනික ව්‍යුහය.
2. නව්‍යතාවයන් හා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ නැඹුරුව.
3. අධ්‍යාපනය හා පුහුණුව.
4. I C T යටිතල පහසුකම්.

## 05. ප්‍රාදේශීය සංවර්ධනය.


- නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල වැඩි ප්‍රතිලාභ හිමි වූයේ නාගරික අංශයටයි. ඒ නිසා ශ්‍රී ලංකාවේ ඉහළ ආර්ථික වෘද්ධියක් හා සමාජ සංවර්ධනයක් හිමි කර ගනු ලැබුවේ බස්නාහිර පළාත හා කොළඹ දිස්ත්‍රික්කය යි. දිවයිනේ සෙසු පළාත් හා දිස්ත්‍රික්ක ඊට සමගාමී ව අඩු සංවර්ධන මට්ටමක් හිමි කර ගත් නිසා තුළිත ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති තෝරා ගත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කෙරිණි.
- ශ්‍රී ලංකාවේ නැගෙනහිර, උතුරු හා ඌව පළාත්වල විරැකියාව, ආදායම් ව්‍යාප්ත විමේ විෂමතා හා දරිද්‍රතාව ඉහළ මට්ටමක තිබූ අතර යටිතල පහසුකම් හා මානව නිපුණතා සංවර්ධනය අඩු මට්ටමක පැවතිණි. මේ නිසා එම දිස්ත්‍රික්ක අළලා ප්‍රාදෙශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පැන නැගිණි. ඒ සඳහා විවිධ ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.

උදා - ග්‍රාම ශක්ති ව්‍යාපාරය, ගම්පෙරළිය වැඩසටහන, උදාගම් වැඩසටහන, ගම නැගුම, ගැමි පුබුදුව, ගැමිදිරිය, ග්‍රාමීය විදුලි යොජනා ක්‍රම. ඒ අතර වේ.

### ප්‍රධාන සුභසාධන වැඩසටහන් 2017 - 2021

| වර්ෂය | දිවි නැගුම / සමෘද්ධි සහනාධාරය | | පෝෂණ දීමනා වැඩසටහන. | | වියළි සලාක වැඩසටහන. |
|---|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | වටිනාකම රුපියල් මිලියන. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වටිනාකම රුපියල් මිලියන. | වටිනාකම රුපියල් මිලියන |
| 2017 | 1 388 242 | 39 707 | 372 407 | 5 408 | 84 |
| 2018 | 1 384 021 | 39 239 | 329 047 | 5 490 | 58 |
| 2019 | 1 800 182 | 44 660 | 300 246 | 5 279 | 105 |
| 2020 | 1 770 086 | 52 434 | 238 034 | 4 761 | ලැනො |
| 2021 | 1 760 485 | 55 400 | 250 848 | 5 238 | ලැනො |

### දිස්ත්‍රික්ක මට්ටමේ බහුමාන දරිද්‍රතා දර්ශකය. 2019




දරිද්‍රතාවයට අදාළ බහුවිධ මානයන්ට අනුව දළ වශයෙන් ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකුගෙන් එක් අයෙක් දරිද්‍රතාවයෙන් පෙලෙන ජන කොට්ඨාසය, දිස්ත්‍රික් අතර සැලකිය යුතු මට්ටමේ විෂමතාවක් සහිත ව බර තැබූ එම බහුමාන දර්ශකවලට අනුව සාමාන්‍යයෙන් 42%ක් විහීනතාවය අත්විඳින බව අනාවරණය වේ.

### පසුගිය විභාග ප්‍රශ්න

*( 2012 A / L)*

01. (iv) " දිවි නැගුම " වැටසටහනෙහි ප්‍රධාන ලක්ෂණ සැකෙවින් විස්තර කරන්න. ( ලකුණු 05)

**පිළිතුරට අඩංගු විය යුතු කරුණු.**

කුටුම්බවලට තමන්ගේ එදිනෙදා පරිභෝජනයට අවශ්‍යය කරන එළවළු සහ පලතුරු තම ගෙවත්තේම නිපදවා ගැනීමටත්, දෛනික ආහාර අවශ්‍යතා සඳහා වෙළෙඳ පොළ මත රඳා පැවැත්ම අඩු කිරීමත්, කුටුම්බයේ මූල්‍යමය සුරක්ෂිතතාව ඉහළ නැංවීමටත් අරමුණු කර ගනිමින් 2011 අයවැය ලේඛනයෙන් දිවි නැගුම වැඩසටහන හඳුන්වා දෙන ලදී.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු කිහිපයකි.

1. කුටුම්බයේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.
2. කුටුම්බයේ ජීවන වියදම් පහළ දැමීම.
3. එළවළු හා පලතුරු නිෂ්පාදන 25% කින් වැඩි කිරීම.
4. ප්‍රතිශීර්ෂ එළවළු පරිභෝජනය දිනකට 134 Kg සිට 175Kg දක්වා වැඩි කිරීම.
5. අතිරික්ත නිෂ්පාදනය අලෙවි කර අතිරේක ආදායමක් උපයා ගැනීම.

2011 මාර්තු මාසයේ දී ආරම්භ කළ මෙම වැඩසටහන ප්‍රථම වටය යටතේ පවුල් මිලියනයක් සවිබල ගැන්වීමට සැලසුම් කරන ලදී ග්‍රාම නිලධාරී වසමකට පවුල් 100ක් බැගින් තෝරා ගනු ලැබිණි.

ගෙවතු සැකසීම. එළවළු හා පලතුරු වගාව, පරිසිර හිතකාමී වාතාවරණයක් ගොඩනැගීම, ගෘහස්ථ කර්මාන් ඇරඹීම මේ යටතේ අපේක්ෂා කෙරිණි.

රජය විසින් පොහෝ මා බීජ සපයන ලද අතර පොල් පැළ, පලතුරු පැළ හා ඖෂධ පැළ බෙදා දීම කුකුළු පැටවුන් ලබාදීම මේ යටතේ සිදු කෙරිණි.

2011 ඔක්තෝම්බර් මාසයේ දී ආරම්භ කරන ලද දෙවන වටය යටතේ ගෘහ කර්මාන්ත, ස්වයං රැකියා, ධීවර හා සත්ත්ව පාලනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණි.

මේ වන විට නිවාස මිලියන 2.5 ක් දිවි නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. කිලිනොච්චිය හැර අන් සියලු දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ.

*( 2010 A / L)*

02. (i) '' ගැමිදිරිය '' ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය ව්‍යාපෘතියේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න.

( ලකුණු 05)

**<u>පිළිතුරට අඩංගු විය යුතු කරුණු.</u>**

ශ්‍රී ලංකාවේ තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක ( බදුල්ල, මොනරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර හා පොළොන්නරුව) දිළිඳුකර පිටුදැකීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ ආරම්භ කරන ලද ප්‍රජා සහභාගීත්ව වැඩසටහනකි.

ප්‍රජා සහභාගීත්වය හා ගැමි ප්‍රජාව සවිබලකරණය කිරීම මගින් ග්‍රා සංවර්ධන කටයුතු සැලසුම් කර තිරසාර සංවර්ධනයක් පවත්වා ගෙන යාම පිණිස වඩාත් යෝග්‍ය ග්‍රාම සංවර්ධන ආකෘතියක් මඟින් දිළිඳුකම අවම කිරීමට මෙමඟින් කටයුතු කෙරිණි.

ප්‍රජා පාලිත ග්‍රාම සංවර්ධන ප්‍රවේශයක් අනුව ගමේ සමීක්ෂණයක් සිදු කර ගමේ අවශ්‍යතා හඳුනා ගෙන ගමේ සංවර්ධන සැලැස්ම ගමේ ප්‍රජාව විසින් ම බැහැරින් අවශ්‍යය සහය පමණක් ලබා ගෙන සකස් කරනු ලැබේ.

දිළිඳුකම හා ප්‍රජාවගේ ප්‍රකාශිත කැමැත්ත මත ස්වං තේරීමේ ක්‍රියාවලියකින් තෝරා ගත් ගම්වල ජනතා සංවිධනයක් පිහිටුවා ගැනේ. එම සංවිධානය ගමේ පවුල්වලින් 80% කට වඩා වැඩි කැමැත්තකින් පිහිටුවා ගැනේ. එය සමාගම් පනත යටතේ ලියාපදිංචි කෙරේ.

ගමේ සංවර්ධන සැලැස්ම ගමේ පවුල්වලින් 80% කට වඩා වැඩි සංඛ්‍යාවක හා එම පිරිසෙන් 50% කට වඩා වැඩි කාන්තාවන් සංඛ්‍යාවක සහභාගීත්වයෙන් පවත්වනු ලබන මහා රැස්වීමක දී අනුමත කොට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය මුදල් ගැමිදිරිය පදනම මඟින් සෘජුව ම ජනතා සමාගමට ලබා දේ.

ගමේ මූලික අවශ්‍යතා ඉටුවන යටිතල පහසුකම් සැපයෙන ව්‍යාපෘති යෝජනා ප්‍රජාව විසින් 10% ක මූල්‍ය දායකත්වයක් හා 20% ක ශ්‍රම දායකත්වයක් ලබා දීමට එකඟ වී මහා සභාවේ දී අනුමත කරගනු ලබන අතර අදාළ ව්‍යාපෘති යෝජනා තාක්ෂණික, සමාජයීය හා පාරිසරික වශයෙන් ඇගැයීමට ලක් කර ඒවායේ නඩත්තුව ප්‍රජාව විසින් ම සිදු කරනු ලබන වැඩ පිළිවෙළක් පිළිබඳ ව සෑහීමකට පත් වීමෙන් පසුව ජනතා සමාගමට අරමුදල් සෘජු ව ම ලබා දෙනු ලැබේ.

ප්‍රජා සංවර්ධනය හා ජීවන මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා ස්වං තීරණ ගැනීම, සැළසුම්කරණය, සම්පත් මෙහෙය වීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගැයීම පෙරදැරි කරගත් ප්‍රයත්නයක් කරා යොමු වූ ආයතනික ව්‍යුහයක් පිහිටුවා ශක්තිමත් ව පවත්වා ගෙන යාම පිණිස ග්‍රාමීය ප්‍රජාව සවිබල ගන්වනු ලැබේ.

ගමේ දිළිඳු ජනතාව මුළුමනින් ම කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වී ඉතුරුම් හා ණය ක්‍රියාවලිය පිළිබඳ ව මනා පුහුණුවක් ලබා ගමේ ඉතුරුම් ගමේ ආර්ථිකයට ආයෝජනය කිරීමට ඉඩ ලැබෙන පරිදි ඉතුරුම් හා ණය අරමුදලක් පිහිටුවා ගෙන ඇත.

## 12. 3

## සමකාලීන ආර්ථික සිදුවීම් හා ප්‍රතිපත්ති.

- වර්තමාන ලෝකයේ සෑම රටක් ම බාහිර ලෝකයට විවිධ ප්‍රමාණයෙන් විවෘත ව පවතී. එනම් ආවෘත ආර්ථිකයක් ලෝකයේ කිසිදු රටක නැත. ඒ නිසා ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට දේශීය සංසිද්ධි මෙන් ම ගෝලීය සිදුවීම් ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබයි.
- මෙහි දී දේශීය හා ගෝලීය සිදුවීම් ආර්ථිකයේ විවිධ අංශ වෙත සෘජුව හෝ වක්‍ර ලෙස බලපෑම ඇති කරයි. එනම් සාර්ව ආර්ථිකයේ,

    1. නිෂ්පාදනය.
    2. සේවා නියුක්තිය.
    3. මිල මට්ටම.
    4. පොලී අනුපාතය.
    5. අන්තර් ජාතික වෙළෙඳාම.
    6. ගෙවුම් ශේෂය.
    7. විදේශ විනිමය අනුපාතිකය.
    8. ප්‍රාග්ධන වෙළෙඳ පොළ.

## ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ දේශීය සිදුවීම්.

- ආණ්ඩු බලය වෙනස් වීම.

    1. 1977 දී පත්වූ නව රජය ක්‍රියාත්මක කළ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා විදේශ වෙළෙඳ රටාව, දේශීය වෙළෙඳ පොළ රටාව, කර්මාන්ත ව්‍යුහය, මූල්‍ය හා බැංකු පද්ධතිය මුළුමනින් ම වෙනස් විය.
    2. 1994 දී ආණ්ඩු බලය වෙස වීම සමඟ ඇති වූ ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් නිසා ආර්ථිකය ගමන් කළ දිශාව කිසියම් ප්‍රමාණයකින් වෙනස් විය. පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම, මිල ස්ථායිතාව, සේවා වියුක්ති ගැටලු අවම කිරීම, නීතිය හා සාමය තවදුරටත් ශක්තිමත් කිරීම ආදී වශයෙන් කාලීන වෙනස්වීම් ගණනාවක් සිදුවිය.
    3. 2006 වර්ෂයේ දී ආණ්ඩු බලය වෙනස්වීමත් සමඟ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ නව ආර්ථික ප්‍රතිපත්ති හා ගැළපුම් ක්‍රියාත්මක කිරීම සිදුවිය.
        - දේශීය කර්මාන්ත අංශය ශක්තිමත් කිරීම.
        - පෞද්ගලීකරණ වැඩපිළිවෙළ සීමා කිරීම.
        - විදේශ ආයෝජන මෙරටට ගලා ඒම සඳහා විවිධ ව්‍යාපෘති ආරම්භ කිරීම.
        - විදේශ ණය ගැනීම් වැඩි වීම.
        - යටිතල පහසුකම් සංවර්ධනය,
        - කර්මාන්ත හා කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය.
    4. 2015 වර්ෂයේ දී ආණ්ඩ බලව වෙනස්වීමත් සමඟ,
        - නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම.
        - සමාජයීය වෙළෙඳ පොළ ආර්ථිකයක් කරා නැඹුරු වීම.
        - යහපාලනය පිළිබඳ කථිකාව.
        - ජාතික ඒකාබද්ධතාවයක් ඇති කිරීම.
        - පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවේශ වීම.

❖ 1983 වර්ෂයේ සිට අවුරුදු 30ක කාලයක් පැවති යුද තත්ත්වය නිසා.

1. රටේ යටිතල පහසුකම් , කර්මාන්ත ශාලා, කෘෂිකාර්මික ගොවිබිම් විනාශ විය.
2. නිෂ්පාදනය පහත වැටිණි.
3. විරැකියාව වැඩි විය.
4. දේශීය සම්පත් ඌන උපයෝජනයට ලක් විය.
5. රජයට ආරක්ෂක කටයුතු වෙනුවෙන් විශාල මුදලක් වැය කිරීමට සිදුවිය.

❖ 1989 සිට 1991 දක්වා ලංකාවේ සෙසු ප්‍රදේශවල ක්‍රියාත්මක වූ සිවිල් අරගලය නිසා ද,

1. රටේ නිෂ්පාදන මට්ටම පහළ ගියේ ය.
2. මිල මට්ටම ඉහළ ගියේ ය.
3. රාජ්‍ය හා පෞද්ගලික දේපොළ විනාශ විය.
4. යටිතල පහසුකම් විනාශ විය.

❖ එමෙන් ම කලින් කල ඇති වූ ස්වභාවික විපත් ශ්‍රී ලංකා ආර්ථිකය බොහෝ බලපෑම් ඇති කළේ ය.

1. 2004 වර්ෂයේ ඇති වූ සුනාමි තත්ත්වය.
2. වරින් වර ඇති වූ ගංවතුර තත්ත්ව.
3. වරින්වර ඇති වූ නියඟ තත්ත්ව.
4. වන සතුන්ගෙන් වන හානි.

❖ මෑත කාලීන ව ක්‍රියාතමක වූ ආගමික අන්තවාදී ගැටුම් ආර්ථිකය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේ ය. එු අතර 2019 වර්ෂයේ අප්‍රේල් මාසයේ ඇති වූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය නිසා සංචාරක කර්මාන්තයට මෙන් ම විදෙශ ආයෝජන මෙරටට ගලා එම සමබන්ධයෙන් ද ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය කළේ ය.

❖ මෑත කාලයේ දීර්ඝ කාලයක් පුරා ක්‍රියාත්මක වූ වැඩ වර්ජන හා උද්ඝෝෂණ ව්‍යාපාරයන් ද රටේ පැවති අස්ථාවර දේශපාලන වාතාවරණය ද  මෙරට ආර්ථිකය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේ ය.


❖ මෑත වර්ශවල රජයේ අක්‍රමවත් මූල්‍ය පාලනය හා අවිධිමත් මූල්‍ය හැසිරවීම, විනිවිද බවින් තොර ණය කළමනාකරණය, මෙරට ආර්ථිකයේ දැඩි බිඳ වැටීමට තදින් බලපෑවේ ය. මේ නිසා විදේශ සංචිත අඩුවීම, විදේශ ණය අර්බුදය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ගැටලු හා බලශක්ති අර්බුදය නිර්මාණය විය.

❖ 2021 වර්ෂයේ රජය රසායනික පොහොර භාවිතය තහනම් කිරීම නිසා මෙරට කෘෂිකර්මාන්තයට දැටි බලපෑමක් එල්ල විය. මේ නිසා දේශීය වශයෙන් ආහාර නිෂ්පාදනය අඩුවීමත්, ආහාර ද්‍රව්‍යවල මිල ඉහළයාමත් නිසා විශාල වශයෙන් ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමට සිදු විය.

❖ ඉන්ධන මිල ගණන් ඉහළ යෑම හා ඉන්ධන අර්බුදය නිසා විවිධ නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි කටයුතුවලට සෘජු ව දැඩි බලපෑමක් එල්ල විය. මේ නිසා අත්‍යවශ්‍යය භාණ්ඩවල මිල ගණන් ද ඉහළ ගියේ ය. ජනතාවගේ ජීවන තත්ත්වය හා පෝෂණ මට්ටම කෙරෙහි මෙය තදින් බලපෑවේ ය.

❖ ඉන්ධන මෙන් ම වෙනත් බලශක්ති ප්‍රභවයන්ගේ ඇති වූ අර්බුදකාරී තත්ත්වය නිසා  මෙරට ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල විය. විදුලිය අර්බුදය මෙන් හ ගෑස් අර්බුදය ද ඒ අතර වෙයි. මේ නිසා සුළු පරිමාණ හා මහා පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය ද සාමාන්‍ය ජන ජීවිතය ද කඩා වැටීමකට ලක් විය.

❖ විදේශ සේවා නියුක්තිකයන්ගේ පෙ(ෂණ සැලකිය යුතු පදිරි අඩු වීම නිසා 2021 වර්ෂයේ දී විදේශීය ජංගම ගිණුමේ හිගය සැලකිය යුතු පරිදි ඉහළ ගියේ ය.




❖ අපනයන ආදායම් ඉක්මවා ආනයන වියදම් ඉහළ යාම නිසා වෙළෙඳ හිගය පුළුල් විය. මේ නිසා ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළ ගියේ ය. එන්නත වැනි ඖෂධ ආනයන වියදම් ඉහළ යාම, ආනයන මත පනවා තිබූ ඇතැම් සීමා ලිහිල් කිරීම හා ඉන්ධන ආනයනයට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම යන කරුණු ආනයන වියදම් ඉහළ යාමට හේතු විය.


❖ ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ආහාර නො ව ද්‍රව්‍යයන්ගේ මිල ගණන් ඉහළ යාමත් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යාමත්, අභ්‍යන්තර සැපයුම් ජාලවල ඇති වූ අවහිරතාත්, විවිධ මිල සංශෝධනයන් නිසා ඇති වූ ඍජු හා වක්‍ර බලපෑම්, දේශීය භාණ්ඩ ඉල්ලුම ඉහළ යාම වැනි කරුණු නිසා පොදු මිල මට්ටමේ ඉහළ යාමක් වාර්තා කළේ ය.


❖ කොවිඩ් 19 වැනි වසංගත තත්ත්ව නිසා සමාජ ආරක්ෂක ප්‍රතිපත්ති දැඩි බලපෑමකට ලක් විය. දරිද්‍රතාවයට අදාළ බහුමාන දත්තවලට අනුව ශ්‍රී ලාංකිකයන් හයදෙනෙකුගෙන් එක් අයෙක් දරිද්‍රතාවයෙන් පෙළෙන බවත් 42% පමණ විහීනතාවයෙන් පෙළෙන බව ද අනාවරණය වී ඇත.

❖ කොවිඩ් රෝග ඔර්දනයට ගත් ක්‍රියාමාර්ගයක් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ රජයේ හා රජයේ නඅමත පෞද්ගලික පාසල් වසා දමා තිබිණි. මේ නිසා පාසල් අධ්‍යාපන කටයුතු හා උසස් අධ්‍යාපන කටයුතු අන්තර්ජාල මාර්ගගත ක්‍රමවේදයන්ට අනුව සිදුවිය. මේ නිසා අන්තර්ජාල භාවිතය ඉහළ ගියේ ය.




❖ විදේශ විනිමය ගෙවීම් සීමාවීම හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් මාධ්‍යයේ නිල සංචිත පහළයාම.



## 2020 වර්ෂයේ මෙන් ම 2021 වර්ෂයේ ද සමස්ත


## දළ නිල සංචිත 2020 = ඇමරිකන් ඩොලර්

- 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විදේශ ණය තත්ත්වය ඉහළ යෑම. මුළු විදේශීය ණය ප්‍රමාණය 2020 වර්ෂයේ අවසානයේ ඇමරිකන් ඩොලර් බිලියන 49. 7කි. එය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 60. 5 % කි. එමෙන් ම 2021 වර්ෂය අවසානයේ දී මුළු විදේශීය ණය ප්‍රමාණය ඇමරිකන් ඩොලර් බිලියන 50. 7කි. එය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 60% කි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම පහළ ම අගය වාර්තා කිරීම ලිහිල් බදු ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යාම, ආනයන සීමා කිරීම, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වීම යන කරුණු මේ සඳහා බලපෑවේ ය.

## රාජ්‍ය ආදායම් සම්පිණ්ඩනය

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) |
|---|---|---|
| රුපියල් මිලියන | | |
| **බදු ආදායම** | **1,216,542** | **1,298,019** |
| ආදායම් බදු | 268,249 | 302,115 |
| එකතු කළ අගය මත බදු | 233,786 | 308,213 |
| නිෂ්පාදන/සුරා බදු | 321,932 | 306,861 |
| ආනයන මත බදු | 114,183 | 64,339 |
| අනෙකුත් බදු | 278,392 | 316,490 |
| **බදු නොවන ආදායම** | **151,417** | **159,052** |
| **මුළු ආදායම** | **1,367,960** | **1,457,071** |
| ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ) | | |
| **බදු ආදායම** | **8.1** | **7.7** |
| ආදායම් බදු | 1.8 | 1.8 |
| එකතු කළ අගය මත බදු | 1.6 | 1.8 |
| නිෂ්පාදන/සුරා බදු | 2.1 | 1.8 |
| ආනයන මත බදු | 0.8 | 0.4 |
| අනෙකුත් බදු | 1.9 | 1.9 |
| බදු නොවන ආදායම | 1.0 | 0.9 |
| **මුළු ආදායම** | **9.1** | **8.7** |

## රාජ්‍ය ආදායමේ




- 2021 වර්ෂයේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් දුර්වල වූ අතර අය වැය හිගය මූල්‍යකරණය දේශීය මූලාශ්‍ර හරහා සිදු කළේ ය. 2020 වර්ෂයේ වාර්තා වූ අය වැය හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 11. 1 % කි. (රුපියල් බිලියන 1 667. 7කි) 2021 වර්ෂයේ දී අය වැය හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 12. 2 % කි. (රුපියල් බිලියන 2 057. 9කි) 2021 වර්ෂයේ වර්තන ගිණුමේ හිගය රුපියල් බිලියන 1 290. 4 කි.

ඉල්ලුම හා සැපයුම් යන අංශයන්හි ප්‍රවණතා හේතුවෙන් 2021 වර්ෂයේ උද්ධමනය ඉහළ ගියේ ය. 2021 වර්ෂයේ අවසානය වන විට කොළඹ පාරිභෝගික මිල දර්ශකය 12. 1% කින් ඉහළ ගිය අතර 2022 අප්‍රේල් මාසයේ දී 29. 8% කින් ඉහළ ගියේ ය.

### ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ ගෝලීය සිදුවීම්.

- ආසියානු මූල්‍ය අර්බුදය.

අග්නිදිග ආසියාතික කලාපයේ මල්‍ය වෙළෙඳ පොළ දැඩි පීඩනයකට ලක්වීම නිසා එම කලාපයේ විදේශ ව්‍යවහාර මුදල් ඒකක දැඩි ලෙස අවප්‍රමාණ විය. මේ නිසා ශ්‍රී ලංකා රුපියල ද අවප්‍රමාණය විය. එම කලාපයේ ආනයනය කරන භාණ්ඩවල මිල ගණන් මේ නිසා ඉහළ ගියේ ය.

❖ යුරෝපා ආර්ථික අර්බුදය.

2006 වර්ෂයේ සිට ඇමෙරිකානු හා යුරෝපා කලාපවල ඇති වූ ආර්ථික අවපාතය නිසා එම කලාපයේ නිෂ්පාදනය පහළ ගිය අතර විරැකියාව වැඩි විය. මල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. දැඩි රාජ්‍ය ණය අර්බුදයක් හට ගැණිනි. මෙය ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳ පොළ, විදේශ සේවා නියුක්තිය, විදේශ ආයෝජන කෙරෙහි විශාල බලපෑමක් සිදු කළේ ය.

❖ ගෝලීය වශයෙන් රටවල් අතර දිගින් දිගට ම ඇති වූ අර්බුදයන්.

විශේෂයෙන් ඉරානය - ඉරාකය, ඇෆ්ගනිස්ථානය, සිරියාව, යුක්රේනය හා රුසියාව ආදී රටවල ඇති වූ යුද ගැටුම් නිසා ඛනිජ තෙල් මිල ඉහළ යාම, ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳ පොළ බිඳ වැටීමට හා විදේශ ආයෝජන අඩු වීම කෙරෙහි බලපෑවේ ය.

❖ ලෝකයේ ඛනිජ තෙල් හා රත්‍රන් මිල ඉහළ යාම.

මේ නිසා ලංකාවේ ආනයන වියදම් ඉහළ යාම, ගෙවුම් ශේෂ හිගය, රුපියලේ විදේශ අගය අඩුවීම, බලශක්තිය හා බැඳුණු උද්ධමනය ඉහළ යාම යන අංශයන්ගෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑවේ ය.

❖ ලෝක ආහාර අර්බුදය.

2000 වර්ෂයේ මුල් වකවානුවේ දී ලෝකයේ ආහාර නිෂ්පාදනය කරන රටවල්වල ඇති වූ බලපෑම් නිසා සහ ඉන්ධන නිෂ්පාදනයට ආහාර විශාල වශයෙන් යොදා ගැනීම නිසා දැවැන්ත ආහාර හිගයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ආනයන කරන තිරිඟු පිටි, කිරි පිටි හා සීනි ආදී ආහාරවල මිල ගණන් ඉහළ ගියේ ය.

❖ ගෝලීය උෂ්ණතවය ඉහළ යාම හා විවිධ කලාපවල ඇති වූ ස්වභාවික විපත්.

ශීඝ්‍ර කාර්මීකරණයත් සමඟ ගෝලීය අවකාශයට මුදා හැරෙන අහිතකර වායුන් නිසා ගෝලීය උෂ්ණත්වය ශීඝ්‍රයෙන් ඉහළ යාමෙන් ග්ලැසියර් ඛාදනයවීමෙන් සාගර ජල මට්ටම ඉහළ යාම සිදුවේ. එමෙන් ම සාගර සමපත විනාශ වීම෴ හෝග ඵලදාව අඩ වීම ද මේ නිසා සිදුවේ. කෘෂිකාර්මික රටක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි මෙම තත්ත්වය විශාල වශයෙන් බලපෑවේ ය.

❖ කොවිඩ් - 19 වසංගත තත්ත්වය.

චීනයේ වුහාන් නගරය කේන්ද්‍ර කර ගනිමින් ඇති වූ කොරෝනා රෝගය සමස්ත ලෝකයට ම බලපෑ ගෝලීය අර්බුදයකි. 2019 වර්ෂයේ ඇති වූ මෙම රෝග තත්ත්වය වර්තමාන ලංකාවේ ඇති තිබෙන බොහෝ ආර්ථික, සමාජ, දේශපාලනික තත්ත්වයන්ට හේතු සාධක විය. රෝග ඔර්දනය ගන්නා ලද යම් යම් සෞඛ්‍යමය ක්‍රියා පිළවෙල ලෝක ආර්ථිකයට දැඩි සේ බලපෑවේ ය.

මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ඉතිහාසය අන් කිසි දිනෙක මුහණ නො දුන් පීඩාකාරී ආර්ථික තත්වයකට මුහුණ දී සිටී.

1. අවම මට්ටමේ නිල සංචිත ප්‍රමාණය.
2. ඇතැම් විදේශ න්‍ය ගෙවීම් අත්හිටුවීම.
3. ඉහළ යන උද්ධමනය.
4. විනිමය අනුපාතිකය සැලකිය යුතු පරිදි අවප්‍රමාණ්‍ය වීම.
5. ඉතා අඩු රාජ්‍ය මූල්‍ය අවකාශය.
6. ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බලපෑම් කරන බලශක්ති අර්බුදය.
7. සමාජ හා දේශපාලන නොසන්සුන්තාව.

## ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය හා ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කිරීම.

## පසුගිය විභාග ප්‍රශ්න

*( 2021 / 2022 A / L)*

01. (i) ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුමක් (***Currency swap agreement***) යනු කවරක් ද? ශ්‍රී ලංකාව ඇසුරින් නිදසුනක් දක්වන්න. ( ලකුණු 04)

(ii) ආයෝජන විශ්වාසනීයත්වයට සහ තරගකාරීත්වයට බාධා කෙරෙන ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ගැටලුකාරී

ක්ෂේත්‍ර සඳහන් කරන්න. ( ලකුණු 04)

(iii) ශ්‍රී ලංකා ආර්ථිකය වර්තමානයේ මුහුණ පා සිටින විදේශ විනිමය අර්බුදය විසඳා ගැනීම සඳහා ඔබට යෝජනා කළ හැකි ප්‍රතිපත්ති නිර්දේශ කවරේ ද? ( ලකුණු 04)

(iv) මෑත වර්ෂවල ආර්ථික වෘද්ධි අනුපාතිකය, අය - වැය හිගය සහ රාජ්‍ය ණය යන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකා ආර්ථිකය පෙන්නුම් කළ කාර්යසාධනය යෝග්‍ය දත්ත යොදා ගනිමින් සැකෙවින් විස්තර කරන්න.

( ලකුණු 08)

***( 2020 A / L ( NEW))***

02. (i) සිව්වන කාර්මික විප්ලවය (***4 IR***) යනු කුමක් ද? ඒ සඳහා මුහුණ දීමට ශ්‍රී ලංකාව සූදානම ද?

( ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාව මත කොවිඩ් - 19 වසංගතය සිදු කර ඇති ආර්ථික බලපෑම සැකෙවින් විස්තර කරන්න.

( ලකුණු 05)

(iii) ''දීර්ඝ කාලයක් පුරාවට ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකාව අපොහොසත් ව සිටී.'' මෙම ප්‍රකාශ තහවුරු කර, ශ්‍රී ලංකා ආර්ථිකයේ ඌන සාධනයට බලපා ඇති හේතු සඳහන් කරන්න.

( ලකුණු 05)

(iv) ''නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන අත්දැකීම් පැහැදිලි ව පෙන්වා දෙනුයේ ආර්ථික ප්‍රතිපත්ති තීරණය කරනු ලැබ ඇත්තේ බොහෝ දුරට කාර්යක්ෂමතාව මත පදනම් ව නො ව දෘෂ්ටිවාදයන් මත පදනම් ව ය.'' නිදසුන් සහිත ව මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. ( ලකුණු 05)

***( 2020 A / L ( OLD ) )***

03. (i) යටිතල පහසුකම් යනු කුමක් ද? එය ආර්ථික වෘද්ධියට දායක වන්නේ කෙසේ ද?

( ලකුණු 05)

(ii) ගත වූ වසර කිහිපය පුරා ශ්‍රී ලංකා ආර්ථික පෙන්නුම් කළ දුබල ආර්ථික සාධන මට්ටමට හේතු පැහැදිලි කරන්න. ( ලකුණු 05)

(iii) ''මන්දගාමී ආර්ථික වෘද්ධිය ශ්‍රී ලංකාව මැද ආදායම් උගුලෙහි සිර කොට ඇත.'' මෙම ප්‍රකාශයට පක්ෂ ව ඉදිරිපත් කළ හැකි තර්ක මොනවා ද? ( ලකුණු 05)

(iv) කොවිඩ් - 19 වසංගතය ශ්‍රී ලංකා ආර්ථිකය මත සිදු කොට ඇති බලපෑම පිළිබඳ ලුහුඬු සටහනක් ලියන්න.

( ලකුණු 05)

***( 2019 A / L ( NEW ) )***

04. (i) ආර්ථික වෘද්ධිය සහ රාජ්‍ය ණය තිරසාර භාවය අත්කර ගැනීමෙහි ලා මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය සැකෙවින් විස්තර කරන්න. ( ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාව ඉහළ ආදායම් රටක තත්ත්වය කරා ප්‍රගමනය වීම වළක්වා ඇති සාධක කවරේ ද?

( ලකුණු 05)

(iii) '' දේශගුණික විපර්යාස හමුවේ අතිශය අනතුරුදායක තත්ත්වයක පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව නම් කර ඇත. '' දේශගුණික වෙනස්කම් නිසා හටගන්නා ආපදා හේතුවෙන් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය සහ රාජ්‍ය මූල්‍ය කෙරෙහි ඇති විය හැකි බලපෑම් සැකෙවින් විස්තර කරන්න. ( ලකුණු 05)

(iv) චීනය මඟින් ක්‍රියාත්මක කර ඇති '' තීරයක් සහ මාවතක් '' ව්‍යාපෘතියේ (**Belt and Road Initiative**) ප්‍රධාන ලක්ෂණ හා එමඟින් ශ්‍රී ලංකාවට ලැබේ යැ'යි ගම්‍යවන ආර්ථික බලපෑම සැකෙවින් පැහැදිලි කරන්න.

( ලකුණු 05)

***( 2019 A / L ( OLD ) )***

05. (i) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති දේශපාලන රෙජිමයන්ගේ වෙනස් වීම් සමඟ ම වෙනස් වී ඇති ආකාරය සැකෙවින් විස්තර කරන්න. ( ලකුණු 05)

(ii) ''අතිශයින් ම අත්‍යවශ්‍යය වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කල් දැමීම නිසා වර්තමානයේ ශ්‍රී ලංකා ආර්ථිකය ඉතා පහත් වෘද්ධි මාවතකට ඇද වැටී තිබේ.'' ශ්‍රී ලංකාව විසින් ක්‍රියාවට නැංවීම ප්‍රමාද කොට ඇති මෙම වෘද්ධි ප්‍රවර්ධන ප්‍රතිසංස්කරණ කවරේ ද? ( ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ ආයෝජනය කෙරෙහි බාධක වශයෙන් පවත්නා ආයෝජන පරිසරයෙහි සහ සාධක වෙළෙඳ පොළෙහි දුබලතා සඳහන් කරන්න. ( ලකුණු 05)

(iv) '' ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රමාණය ඉතා ඉහළ අගයක පවතින අතර ණය කළඹෙහි ස්වභාවය ද ණයෙහි තිරසාරත්වය පිළිබඳ සැලකිය යුතු අවදානමක් පෙන්නුම් කරයි.'' විශේෂයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි ප්‍රමාණය සහ එහි සංයුතිය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. ( ලකුණු 05)

***( 2018 A / L)***

06. (i) ගෝලීය වෙළෙඳ පොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය ඉහළ නැංවීමෙහි ලා යෝග්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමර්ග කවරේ ද? ( ලකුණු 05)

(ii) 2002 - 2016 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ සහ ආදායම් විෂමතාවයේ උපනති පරීක්ෂා කරන්න. ( ලකුණු 05)

(iii) 1977 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූ ආර්ථික නිර්බාධීකරණ ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග වූයේ කවර දෑ ද? ( ලකුණු 05)

(iv) තිරසාර හා වේගවත් ආර්ථික වෘද්ධියක් අත්පත් කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව විසින් ජය ගත යුතු ප්‍රධාන අභියෝග කවරේ ද? ( ලකුණු 05)

***( 2017 A / L)***

07. (i) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා යොදා ගත හැකි උපාය මාර්ග වශයෙන් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයේ වාසි ( ***PPP***) කවරේ ද? ( ලකුණු 05)

(ii) '' ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව හා ආයෝජන වාතාවරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දිගින් දිගට ම අසමත්භාවයක් පෙන්නුම් කර තිබේ.'' ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී බලපා ඇති වඩාත් ගැටලුකාරී සාධක කවරේ ද? ( ලකුණු 05)

(iii) '' සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වේගවත් ව වර්ධනය වන ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ.'' විදේශ විනිමය ඉපැයීම් හා සේවා නියුක්තියට සංචාරක කර්මාන්තයේ මෑත කාලීන දායකත්වය පෙන්වා දී, එම කාර්මාන්තය වර්තමානයේ මුහුණ දී ඇති අභියෝග සාකච්ඡා කරන්න. ( ලකුණු 05)

(iv) '' ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ජනගහනයෙන් අධික් ම සුළු පරිමාණ ගොවියෝ වෙති.'' අඩු ඵලදායිතාව හා අඩු ආදායම් සඳහා හේතු වන දේශීය කර්මාන්තයේ ප්‍රධාන ගැටලු හඳුන්වන්න. ( ලකුණු 05)

***( 2016 A / L)***

08. (i) ''නානාවිධ රාජ්‍ය මූල්‍ය සානුබල තිබියදීත් මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජනයේ හැසිරීම බලාපොරොත්තු කඩ කරන්නක් වී තිබේ.'' සෘජු විදේශ ආයෝජන සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධාන බාධක කවරේ ද? ( ලකුණු 05)

(ii) ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය මූල්‍ය තත්වයෙහි දක්නට ඇති ප්‍රධාන ව්‍යුහාත්මක දූර්වලතා සඳහන් කරන්න. ( ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ මෑත වර්ෂවල වෙළෙඳ ශේෂයේ හිගය පුළුල් වෙමින් පැවතීමට බලපාන හේතු දක්වන්න.

( ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන ආර්ථික වෘද්ධිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි ගෝලීය ආර්ථිකයේ වර්තමානයේ සිදුවන වෙනස්කම් කෙටියෙන් සඳහන් කරන්න. ( ලකුණු 05)

***( 2015 A / L)***

09. (i) '' ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධියේ මූලාශ්‍ර වශයෙන් මෑත වර්ෂවල දී වඩාත් ප්‍රබල ස්ථාන හිමිකර ගෙන ඇත්තේ වෙළෙඳ නො වන දේශීය ආර්ථික ක්‍රියාකාරකම් (***Domestic non tradable economic activities***) වේ.'' මෙම ක්‍රියාකාරකම් කවරේදැ'යි හඳුන්වා දෙන්න. ( ලකුණු 05)

(ii) ' මෑත දශකවල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම හමුදා සහාභාගීත්ව අනුපාතිකය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පවතී.'' ශ්‍රම හමුදාව තුළ ස්ත්‍රී සහභාගීත්ව අනුපාතිකය පහළ මට්ටමක පැවතීමට හේතු කවරේ ද?

( ලකුණු 05)

(iii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ බදු අයහාරය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පහළ වැටෙමින් පැවතීමට හේතු කවරේ ද? ( ලකුණු 05)

(iv) මැදි කාලීන ව සහ දිගු කාලීන ව ඉහළ වෘද්ධි අනුපාතිකයක් අත් කර ගැනීමට බාධක ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට ලැබෙන මූලික දුර්වලතා කවරෙදැ'යි හඳුන්වා දෙන්න. ( ලකුණු 05)

***( 2014 A / L)***

10. (i) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය තීරණ කළ ප්‍රධාන සාධක මොනවා ද?

( ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සේවා අංශයේ වැදගත්කම සැකෙවින් පැහැදිලි කරන්න.

( ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ඉහළ වර්ධනයක් ඇති කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද ?

( ලකුණු 05)

(iv) මෑත කාලීන ව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන යටිතල සංවර්ධන ව්‍යාපෘති කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 05)